# පටුන


**සභාපතිතුමාගේ සමාලෝචනය** ........ 04

**අධ්‍යක්‍ෂ මණ්ඩල වාර්තාව** ........ 06

**සභාපති ඇතුළු අධ්‍යක්‍ෂ මණ්ඩලය** ........ 08

**ප්‍රධාන නිලධාරි මණ්ඩලය** ........ 09

**ආයතනික හැඳින්වීම** ........ 10

හැඳින්වීම ........ 10

දැක්ම හා මෙහෙවර ........ 11

අගනාකම් ........ 11

සංවිධාන ව්‍යුහය ........ 12

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය ........ 13

**විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව** ........ 15

**ක්‍රියාත්මක වැඩසටහන්** ........ 16

**භෞතික සංවර්ධන වැඩසටහන** ........ 16

*ලුනාව නිවාස ව්‍යාපෘතිය* ........ 17

*මහනුවර මහයියාව නාගරික නිවාස ව්‍යාපෘතිය* ........ 19

**මානව සංවර්ධන වැඩසටහන** ........ 20

01. "ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන ........ 21

*1.1 ප්‍රජාව සංවිධානගත කිරීම හා බලගැන්වීම* ........ 21

*1.2 "ස්වශක්ති" ප්‍රජා මූල සංවිධාන ස්ථාපිත කිරීම හා යාවත්කාලීන කිරීම* ........ 22

*1.3 ප්‍රජා ක්‍රියාකාරී වැඩමුළු පැවැත්වීම (CAP Workshops)* ........ 23

02. ළමා කුසලතා, ආකල්ප ප්‍රවර්ධන වැඩසටහන ........ **23**

*2.1 ලෝක ජනාවාස දිනට සමගාමීව පැවැත්වූ තරගයන්හි ජයග්‍රාහකයින් වෙනුවෙන් ත්‍යාග, කුසලාන හා සහතිකපත් ප්‍රදානය* ........ 23

*2.2 2018 ලෝක ජනාවාස දින සැමරුම වෙනුවෙන් පවත්වනු ලැබූ ළමා සිතුවම් තරගාවලියෙහි පළමු අදියර ජනාවාස මට්ටමින් පැවැත්වීම* ........ 24

*2.3 කුරුණෑගල - නිකවැරටිය ළමා සිතුවම් තරගය* ........ 25

*2.4 2018 ලෝක ජනාවාස දින සැමරුම වෙනුවෙන් ළමා කෙටි නාට්‍ය තරගාවලිය* ........ 25

*2.5 2018 ලෝක ජනාවාස දිනට සමගාමීව පැවැත්වූ තරගයන්හි ජයගාහකයින් වෙනුවෙන් ත්‍යාග, කුසලාන හා සහතිකපත් ප්‍රදානය - ලෝක ජනාවාස දින ජාතික සැමරුම් උත්සවය* ........ 27

*2.6 හම්බන්තොට - සූරියවැව අධ්‍යාපන කලාපයේ පැවති ළමා සිතුවම් තරගය* ........ 27

*2.7 නාගරික ජනාවාසයන්හි වෙසෙන ළමුන්ගේ දැනුම, කුසලතා හා ධනාත්මක ආකල්ප ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් මහවැලි කේන්ද්‍රයේදී පැවැත්වීම* ........ 27

*2.8 2018 වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්වයට පෙනී සිටින ළමුන්ගේ මානසිකත්ව ප්‍රවර්ධන වැඩමුළුවක් පැවැත්වීම* ........ 28

2.9 ළමා නායකත්ව කුසලතා ධනාත්මක ආකල්ප ප්‍රවර්ධනය, ක්‍රියාකාරීත්වය ඇතිකරනු වස් ළමා සමිති පිහිටුවීම හා යාවත්කාලීන කිරීම. ..... 28

2.10 2018 ලෝක ජනාවාස දිනට සමගාමීව ළමා දන්ත සායන පැවැත්වීම ..... 29

2.11 ළමා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ..... 29

2.12 ජනාවාස ළමුන් සඳහා උපකාරක පංති පැවැත්වීම ..... 30

2.13 ආගමික වැඩසටහන් සංවිධානය ..... 30

03. තරුණ කුසලතා ප්‍රවර්ධන වැඩසටහන් ..... **31**

3.1 2018 ලෝක ජනාවාස දිනට සමගාමීව නාගරික ජනාවාස තරුණියන් සඳහා එක්දින රූපලාවන්‍ය පුහුණු වැඩුමුළුවක් පැවැත්වීම ..... 31

3.2 2018 ලෝක ජනාවාස දිනය අරමුණු කරගනිමින් තරුණ නායකත්ව කුසලතා හා පෞරුෂත්ව පුහුණු වැඩුමුළුවක් පැවැත්වීම ..... 31

3.3 තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ..... 32

04. ව්‍යවසායකත්ව හා ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන ..... **32**

4.1 කුඩා කණ්ඩායම් ස්ථාපිත කිරීම ..... 32

4.2 “දිරියට දිරියක්” ස්වයං රැකියා මූල්‍ය සහාය සේවා සැපයීම හා උපකරණ සහාය ලබාදීම ..... 33

4.3 ස්වයං රැකියා පසුවිපරම් කටයුතු ..... 33

4.4 2018 ලෝක ජනාවාස දිනට සමගාමීව කොළඹ නාගරික කලාපයෙහි ස්වයං රැකියාලාභීන් වෙනුවෙන් වෙළඳ පොළක් පැවැත්වීම ..... 33

05. පොදු ප්‍රජා ක්‍රියාකාරී වැඩසටහන් ..... **34**

5.1 අක්ෂි පරීක්ෂා කිරීම හා ඇස් කණ්ණාඩි ලබාදීම ..... 34

5.2 ආයුර්වේද වෛද්‍ය සායන පැවැත්වීම ..... 34

5.3 පවුල් සෞඛ්‍ය සායන වැඩසටහන් පැවැත්වීම ..... 35

5.4 දන්ත වෛද්‍ය සායන වැඩසටහන් පැවැත්වීම ..... 36

5.5 පවුල් සෞඛ්‍ය සායන වැඩසටහන් පැවැත්වීම ..... 36

5.6 ප්‍රජා සමිති වෙත පුටු ලබාදීම ..... 37

5.7 ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ..... 37

5.8 මානව සංවර්ධන වැඩසටහන හා බාහිර ආයතන සම්බන්ධ වීම ..... 38

**මූල්‍ය ප්‍රකාශන** ..... 39

ආදායම් හා වියදම් ගිණුම ..... 39

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ..... 41

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය ..... 44

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ..... 47

**රජයේ විගණන වාර්තාව** ..... 48

# සභාපතිතුමාගේ සමාලෝචනය



නාගරික ප්‍රදේශවල ජීවත්වන අඩු ආදායම්ලාභී ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා ඔවුන්ගේ නිවාස ඇතුළු භෞතික පරිසරය, සාකල්‍ය නාගරික සහ ජනාවාස සංවර්ධන ප්‍රවේශයක් යටතේ සංවර්ධනය කිරීම, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මුඛ්‍ය අරමුණ වන අතර, ඉලක්ක ප්‍රජාව සමාජ, ආර්ථික සහ සංස්කෘතික වශයෙන් බලගැන්වීම ද අප අධිකාරියේ අරමුණු අතර වේ.

ඒ අනුව, මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය භෞතික හා මානව යන දෙවැදෑරුම් සංවර්ධන ප්‍රවේශය යටතේ වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබන අතර 2018 වර්ෂය අවසාන වන විට 11 වන වර්ෂ පූර්ණය සනිටුහන් කරයි.

භෞතික සංවර්ධන ප්‍රවේශය යටතේ මෙම වර්ෂයේ දී අවිච්ඡේද ව්‍යාපෘතියක් ලෙස ලුනාව නාගරික නිවාස ව්‍යාපෘතියෙ හි ඉදිකිරීම් කටයුතු සිදු කරන ලදි. මෙම නිවාස ව්‍යාපෘතිය අඩු පහසුකම් නාගරික ප්‍රජාව සඳහා නිවාස විසඳුම් ලබාදීමේ අරමුණින්, මොරටුව ලුනාව තානායම් ඉඩමෙ හි මහල් 12 කින් (G+11) හා නිවාස ඒකක 356 කින් සමන්විතව රු.මිලි.1,369.316 ක මූල්‍ය ඇස්තමේන්තුවක් සහිතව සැලසුම් කරන ලද නිවාස ව්‍යාපෘතියකි. ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිකිරීම් භාරව කටයුතු කරන අතර ව්‍යාපෘති කළමනාකරණය රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව විසින් සිදු කරනු ලබයි.

නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිමකර මෙම වර්ෂයේ දී ජනතා අයිතියට පත්කිරීමට සැලසුම් කර තිබුණද, සියලු පහසුකම් සහිත මනා නේවාසික පරිසරයක් ව්‍යාපෘති භූමිය තුල ස්ථාපිත කිරීම වෙනුවෙන් අමතර වැඩ කොටස් කිහිපයක් ව්‍යාපෘතියට අලුතින් එක් කිරීමට සිදුවීම මත, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන් නිමකර ජනතා අයිතියට පත්කිරීම 2019 වර්ෂයේ දී සිදු කිරීමට අපේක්ෂිතය.

මීට අමතරව 2018 වර්ෂය සඳහා නව නිවාස ව්‍යාපෘතියක් ලෙස මහනුවර මහයියාව නිවාස ව්‍යාපෘතිය සැලසුම් කරන ලද අතර, මෙම නිවාස ව්‍යාපෘතිය 'MC ජනාවාසය' ඇතුළු මහනුවර නගරයේ ජීවත් වන අඩු ආදායම්ලාභී ප්‍රජාව ප්‍රතිනිවාසකරණය සඳහා, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සැලසුම් කරන ලද නිවාස ව්‍යාපෘතියකි. මෙම නිවාස ව්‍යාපෘතිය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත නිවාස ව්‍යාපෘතියකි.

2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරී පනතින් පැවරුණ කාර්යභාරයක් ලෙස, ඌන පහසුකම් සහිත නාගරික ජනාවාසයන් හි ජීවත් වන ප්‍රජාවගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික ප්‍රවර්ධනය උදෙසා එම ප්‍රජාව බලගැන්වීම මෙන්ම, ඔවුන්ගේ දරුදැරියන්ගේ දැනුම, කුසලතා හා ආකල්පමය වශයෙන් ධනාත්මක ප්‍රවේශයකට යොමු කිරීම උදෙසා ''ස්වශක්ති'' මානව සංවර්ධන වැඩසටහන නාගරික ජනාවාස මට්ටමින් ක්‍රියාවට නැංවීමේ වගකීම මෙම අධිකාරියට පවරා ඇත.

උක්ත කාර්යයන් ක්‍රියාවට නැංවීම සඳහා ''ස්වශක්ති'' මානව සංවර්ධන වැඩසටහන වර්ෂ 2011 දී ආරම්භ කරන ලද අතර 2018 වර්ෂය තුළ ද මේ යටතේ මූලික අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාකාරකම් රාශියක් නාගරික ජනාවාස මටට්ටමින් ඉටු කරන ලදි.

2018 ලෝක ජනාවාස දිනයට සමගාමීව නාගරික දරුදැරියන් තුළ සැඟවුණු නිර්මාණ කෞෂල්‍යයන් ඔප්නංවා ගැනීම සඳහා අටවන වරටත් සිතුවම් හා නාට්‍ය තරඟයන්ගෙන් සමන්විත කලා මංගල්‍යයන් එළිදැක්වීමෙහිලා නව මංපෙත් විවර කරන ලදි.

කුඩා කල සිටම දරුවන්ට ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සඳහා නාගරික ජනාවාස අධිකාරිය මගින් ක්‍රියාත්මක වැඩසටහනක් ලෙස ළමා ඉතුරුම් වැඩසටහන දැක්විය හැකිය. ඒ අනුව 2018 වර්ෂයේ දී ද ලංකා බැංකුව හා එක්ව කොළඹ නාගරික කලාපය තුළ මෙන්ම කොළඹ නාගරික කලාපයෙන් පිටත මානව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක නිවාස ව්‍යාපෘතීන් හි දරුවන් සඳහා ද මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කරන ලදි.

තම පවුලට ආර්ථිකමය වශයෙන් ශක්තියක් වීම සඳහා කාන්තාවන් බොහෝමයක් ස්වයං රැකියාවන් හි නියුතු වනු ජනාවාසයන් තුළ දක්නට ලැබෙන අතර, එසේ තම පවුලේ ආර්ථිකය නඟාසිටුවීම සඳහා කැපවන්නා වූ කාන්තාවන් හට, "ස්වශක්ති කාන්තා සවිය" වැඩසටහන යටතේ සහනදායී ගෙවීමේ පදනම මත මහන මැෂින් ලබාදීම හා රු. 25,000/- ක උපරිමයකට යටත්ව ඉතා සහනදායී පොළී ප්‍රතිශතයක් මත ණය මුදලක් ලබාදීම සිදු වේ.

ඒ අනුව, 2018 වර්ෂය තුළ ස්වයං රැකියාවන් හි නියුතු හා අපේක්ෂිත ප්‍රතිලාභීන් 65 දෙනෙකු සඳහා මහන මැෂින් ලබාදීම සිදු කළ අතර, සහනදායී පොළී අනුපාතයක් මත 74 දෙනෙකු සඳහා ස්වයං රැකියා මූල්‍ය ණය ලබාදීමට කටයුතු කරන ලදි.

මීට අමතරව දිවයින පුරා ක්‍රියාත්මක "සැමට සෙවණ" ආදර්ශ ගම්මාන ජනතා අයිතියට පත්කිරීමට සමගාමීව එම ගම්මානයන් අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරමින්, අඩු ආදායම්ලාභී ප්‍රජාව සඳහා නොමිලේ අක්ෂි පරීක්ෂා කිරීමේ සායන 93 ක් පැවැත් වූ අතර, ප්‍රතිලාභීන් 13,336 දෙනෙකු සඳහා 2018 වර්ෂයේ දී ඇස් කණ්ණාඩි ලබාදීමට කටයුතු කරන ලදි.

**රංජිත් ශාන්ත කහවල**

**සභාපති**

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

# අධ්‍යක්‍ෂ මණ්ඩල වාර්තාව

2018.12.31 දිනට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

**රංජිත් ශාන්ත කහවල මහතා**
සභාපති

**එම්. කේ. ප්‍රදීප් කුමාර මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

**කේ. ඒ. එස්. වල්පොල මහත්මිය**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

**කේ. ඒ. ඩී. චන්ද්‍රදාස මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

**එල්. එස්. පලන්සූරිය මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

**ආචාර්ය මහීම් මෙන්ඩිස් මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

**ඊ. එල්. ඩබ්. සමරසිංහ මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

**ඩබ්. එම්. ගුණරත්න මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

**ඒ. සන්තියාගෝ මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

**ඒ. කේ. පී. විජිත් චන්දිම මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

**ඩී. ඒ. ගාමිණී මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

**වයි. ආර්. ද සිල්වා මහතා**
වැ. බ. අධ්‍යක්ෂ ජනරාල් *(2017.12.18 සිට - 2018.10.01 දක්වා)*
(අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)

**එම්. එස්. වී. විපුලගුණ මහත්මිය**
අධ්‍යක්ෂ ජනරාල්
(අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 10 ක් පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයෙ හි අනු කමිටුවක් ලෙස ක්‍රියාත්මක වන විගණන හා කළමනාකරණ කමිටුව 2018 වර්ෂය තුළ දී රැස්වීම 03 ක් පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයින් වන පහත නම් සඳහන් අධ්‍යක්ෂවරුන් විගණන හා කළමනාකරණ කමිටුවේ සමාජිකයින් ලෙස කටයුතු කරති.

එම්. කේ. ප්‍රදීප් කුමාර මහතා - සභාපති
ආචාර්ය මහීම් මෙන්ඩිස් මහතා
ඒ. කේ. පී. විජිත් චන්දිම මහතා

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් අඩු පහසුකම් සහිත නාගරික ජනාවාසවල පදිංචි ජනතාවට නිවාස විසඳුම් සපයා දෙන අතර, නාගරික ප්‍රදේශවල පිහිටා තිබෙන ජීවත්වීමට සුදුසු තත්වයේ නැති නිවාස සමූහ උසස් තත්ත්වයකට ගෙන ඒමට කටයුතු කරයි. ඒ හා සමගම නාගරික ජනාවාසවල ජීවත් වෙන ජනතාවගේ සමාජ, ආර්ථික තත්ත්වය සංවර්ධනය කිරීම පිණිස මානව සංවර්ධන වැඩසටහන් ද ක්‍රියාත්මක කර ඇත.

1971 අංක 38 දරණ මුදල් පනතේ 12 වැනි සහ 13.6 වැනි වගන්තිය ප්‍රකාරව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලබන සියලුම ගනුදෙනු නිසි පරිදි ගිණුම්ගත කර, ගිණුම් පොත් පවත්වාගෙන යාම, සහතික කිරීමේ වගකීම සහ අධිකාරියේ ගිණුම් කටයුතුවල සහ අදාළ වර්ෂය සඳහා අතිරික්තයේ/ඌණතාවයේ සත්‍ය සහ සාධාරණ මතයක් සපයාදෙන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ වගකීම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි.

ඒ අනුව, නිසි පරිදි ගිණුම් පොත් පවත්වාගෙන යන ලෙසටත්, නිතිපතා පවත්වනු ලබන රැස්වීම්වල දී සහ විගණන කමිටුව හරහා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය සමාලෝචනය කරන ලෙසටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරිය වෙත නියෝග කර ඇත.

මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී, සෑම අවස්ථාවකටම අදාළ වන පරිදි නිසි ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගත කර ගැනීමත්, සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන් සහ ඇස්තමේන්තු මඟින් තහවුරු කිරීමත් අධ්‍යක්ෂ මණ්ඩල විසින් සළකා බලා ඇත.

අධිකාරිය සතු වත්කම් ආරක්ෂා කිරීමටත්, වංචා සහ අනෙකුත් අක්‍රමිකතා සොයා ගැනීමට සහ ඒවා වළක්වා ගැනීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ට ප්‍රායෝගිකව ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරියේ වත්කම් ආරක්ෂා කර ගැනීමට සහ එහි වාර්තාවන් හි නිරවද්‍යතාවය සහ විශ්වාසනීයත්වය ප්‍රායෝගිකව හැකිතාක් දුරට ආරක්ෂා කර ගැනීමට හැකි වන පරිදි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සේවාවන් ක්‍රමානුකූල ආකාරයට ඉටු කිරීමට අවශ්‍ය කරන, අභ්‍යන්තර පරීක්ෂා කිරීම, අභ්‍යන්තර විගණන සහ මූල්‍ය හා අනෙකුත් පාලන වලින් සමන්විත ඵලදායි සහ පරිපූර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපනය කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

**අධ්‍යක්ෂ ජනරාල්**
**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

# සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය



රංජිත් ශාන්ත කහවල මහතා
සභාපති



එම්. කේ. ප්‍රදීප් කුමාර මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික




කේ. ඒ. එස්. වල්පොල මහත්මිය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



කේ. ඒ. ඩී. චන්ද්‍රදාස මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



එල්. එස්. පලන්සූරිය මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ආචාර්ය මහීම් මෙන්ඩිස් මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ඊ. එල්. ඩබ්. සමරසිංහ මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ඩබ්. එම්. ගුණරත්න මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ඒ. සන්තියාගෝ මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ඒ.කේ.පී.විජිත් චන්දිම මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ඩී. ඒ. ගාමිණී මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



වයි. ආර්. ද සිල්වා මහතා
වැ. බ. අධ්‍යක්ෂ ජනරාල්
(අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)
*2017.12.18 සිට 2018.10.01 දක්වා*



එම්. එස්. වී. විපුලගුණ මහත්මිය
අධ්‍යක්ෂ ජනරාල්
(අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)

# ප්‍රධාන නිලධාරී මණ්ඩලය



රංජිත් ශාන්ත කහවල මහතා
සභාපති



එම්. එස්. වී. විපුලගුණ මහත්මිය
අධ්‍යක්ෂ ජනරාල්



වයි. ආර්. ද සිල්වා මහතා
අධ්‍යක්ෂ (සමාජ සජීවීකරණ)
*2018.10.01 දක්වා*
වැ. බ. අධ්‍යක්ෂ ජනරාල්
*2017.12.18 සිට 2018.10.01 දක්වා*



ඒ. ජී. එස්. එන්. නිශාන්ති මහත්මිය
අධ්‍යක්ෂ (මුදල්)



කේ. කේ. ඩබ්. ටී. පී. ද සිල්වා මහත්මිය
*අධ්‍යක්ෂ (සැලසුම් හා ක. තො. ප.)*



ඩී. ඒ. දේවිකා දිසානායක මහත්මිය
සහකාර අධ්‍යක්ෂ (නීති)



ඒ. එම්. කේ. බණ්ඩාර අතාවුද මහතා
සහකාර අධ්‍යක්ෂ (මුදල්)



එම්.ඒ.එස්.එස්. මුණසිංහ මහතා
සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු)



අනුෂා රාජපක්ෂ මෙනවිය
සහකාර අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා)



ඒ. පී. ආර්. ඥානප්‍රිය මහතා
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)



ඩබ්. පී. යු. කේ. පෙරේරා මහත්මිය
සහකාර අධ්‍යක්ෂ (ඉඩම්)



ආර්. ඩී. එස්. සුසන්ත ප්‍රනාන්දු
සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)



අභ්‍යන්තර විගණක
එල්. ආර්. ඒ. ශාන්ත මහතා



ඒ. එල්. හර්ෂ දිලංකර මහතා
සහකාර අධ්‍යක්ෂ (සමාජ සජීවීකරණ)
රාජකාරී ඉටුකරන

සටහන :

*2018.11.09 සිට 2018.12.19 දක්වා*
සභාපති - වෛද්‍ය සුමිත් වන්නිආරච්චි මහතා

*2018.11.09 සිට 2018.12.19 දක්වා*
අධ්‍යක්ෂ ජනරාල් - එම්. ඩී. කේ. චන්ද්‍රසේන මහතා

# ආයතනික හැඳින්වීම

## හැඳින්වීම

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටුවන ලද්දේ

2008 අංක 36 දරණ

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත මඟිනි.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණ වූයේ නාගරික ජනාවාස සංවර්ධනයට අදාල ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම, තිරසර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇතිවනු පිණිස අඩු පහසුකම් නාගරික ජනාවාසවල වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම හා එම ජනතාවට අවම නාගරික පහසුකම් සඳහා ප්‍රවේශය සලස්වමින්, දැනට පවතින නිවාස ඒකක වැඩි දියුණු කිරීම හෝ වඩාත් යහපත් නිවාස පහසුකම් ලබාදීම සඳහා වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම සඳහාත්ය.

## දැක්ම

"තිරසර නාගරික ජනාවාස තුළ උසස් ජීවන රටාවක් සහතික කිරීම"

## මෙහෙවර

"සාකල්‍ය නාගරික සංවර්ධන සැලැස්මකට අනුගතව

ඌණ පහසුකම් සහිත නාගරික ජනාවාසවල සහ

නාගරික කලාපවල වැසියන්ගේ

නිවාස ගැටළුවට විසඳුම් ලබාදීම හා

ඒ හා සමගාමීව ඔවුන් සමාජ, ආර්ථික හා සංස්කෘතික වශයෙන්

සවිබල ගැන්වීම"

## අගනාකම්


- ජනයාගේ ජීවනෝපාය හා සමාජ ජාලවලට බාධාවීම් අවම කරමින්, සියලු ප්‍රයත්නයන් තුළ සමාජ අවංකභාවය හා සුසංයෝගය අප අගය කරන්නෙමු.

- ප්‍රජාවට පැහැදිලි ප්‍රතිලාභ ලැබෙන සහභාගීත්ව තීරණ ගැනීම දිරිගැන්වීමෙන්, අප සේවය කරන ප්‍රජාවන්ගේ අවශ්‍යතා හා අභිලාෂයන් ගැන අප සැමවිටම සංවේදීව සිටින්නෙමු.

- අප කණ්ඩායමේ සියල්ලන්ට ද, අප සේවය කරන ප්‍රජාවගේ සාමාජිකයින්ට ද අප සලකනුයේ අප සැලකිලි ලැබීමට කැමති ආකාරයටය.

- නවෝත්පාදනය, කණ්ඩායමක් වශයෙන් වැඩකිරීම සහ හවුල්වීම් අප විසින් දිරිගන්වන අතර, අපගේ සියලුම කර්තව්‍යයන්හි දී ආචාර විද්‍යාත්මක හා වෘත්තීයමය ප්‍රමිතීන් පවත්වාගෙන යන්නෙමු.

# සංවිධාන ව්‍යුහය


සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය
උපදේශක කමිටුව
අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (සැලසුම් හා ක.තො.ප)
ස.අ./නි.අ. (ප්‍ර. හා සංව.)
අධ්‍යක්ෂ (ඉංජිනේරු)
ස.අ./නි.අ. (වාස්තුවිද්‍යා)
ස.අ./නි.අ. (ඉංජිනේරු)
ස.අ./නි.අ. (ඉඩම්)
ස.අ./නි.අ. (නීති)
අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන)
ස.අ./නි.අ. (සමාජ සංවර්ධන) (03)
ස.අ./නි.අ. (පරිපාලන)
අධ්‍යක්ෂ (මූල්‍ය)
ස.අ./නි.අ. (ප්‍රසම්පාදන)
ස.අ./නි.අ. (මූල්‍ය)
අභ්‍යන්තර විගණක
තාක්ෂණික නිලධාරී 01
ඉංජිනේරු සහකාර 01
අභිනව කාර්ය මණ්ඩලය
පරිපාලන නිලධාරී
සංවර්ධන නිලධාරී (08)
ප්‍රජා සං.සහ. (30)
කළමනාකරණ සහකාර
සමාජ සංවර්ධන සහකාර (20)
තාක්ෂණික සහකාර (08)
සැලසුම් ශිල්පී (01)
කළමනාකරණ සහකාර
ඉදිකිරීම් අධීක්ෂණ සහායක (කොන්ත්‍රාත්)16
නීති සහකාර 01
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
දත්ත සටහන්කරු (02)
රියදුරු (10)
ප්‍රා.ශ්‍රී.සෙ. (09)
ගබඩා භාරකාර සහායක (01)
ලේඛන භාරකරු (01)
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
ක්‍රමලේඛක (01)
කළමනාකරණ සහකාර
ක.ස. 1-1 20
රා.ප. චක්‍ර ලේඛ 25/2014 අනුව
තා.ස. - 01
ක.ස. - 08
රියදුරු - 01
කා.කා.ස. - 04

# නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය

2018-12-31 දිනට

| # | තනතුර | අනුමත ප්‍රමාණය | දැනට සිටින ප්‍රමාණය | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| | | | ස්ථිර | කොන්ත්‍රාත් | |
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - | |
| 02 | අධ්‍යක්ෂ (සමාජ සජීවීකරණ) | 01 | - | - | 01 |
| 03 | අධ්‍යක්ෂ (සැලසුම් හා ක.තො.ප.) | 01 | 01 | - | |
| 04 | අධ්‍යක්ෂ (මූල්‍ය) | 01 | 01 | - | |
| 05 | අධ්‍යක්ෂ (ඉංජිනේරු) | 01 | - | - | 01 |
| 06 | අභ්‍යන්තර විගණක | 01 | 01 | - | |
| 07 | සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | 01 | 01 | - | |
| 08 | සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | 01 | 01 | - | |
| 09 | සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) | 01 | 01 | - | |
| 10 | සහකාර අධ්‍යක්ෂ (වාස්තුවිද්‍යා) | 01 | 01 | - | |
| 11 | සහකාර අධ්‍යක්ෂ (සමාජ සජීවීකරණ) | 03 | - | - | 03 |
| 12 | සහකාර අධ්‍යක්ෂ (නීති) | 01 | 01 | - | |
| 13 | සහකාර අධ්‍යක්ෂ (ඉඩම්) | 01 | 01 | - | |
| 14 | සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන) | 01 | - | - | 01 |
| 15 | සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) | 01 | 01 | - | |
| 16 | පරිපාලන නිලධාරි | 01 | 01 | - | |
| 17 | තාක්ෂණ නිලධාරි | 01 | - | - | 01 |
| 18 | ඉංජිනේරු සහකාර | 01 | - | - | 01 |
| 19 | සංවර්ධන නිලධාරි | 08 | 04 | - | 04 |
| 20 | පද්ධති විශ්ලේෂක | 01 | 01 | - | |
| 21 | සැලසුම් සහකාර | 01 | 01 | - | |
| 22 | දත්ත සැලසුම් සහකාර | 01 | 01 | - | |
| 23 | සැලසුම් සහකාර (ක.තො.ප) | 01 | 01 | - | |

| # | තනතුර | අනුමත ප්‍රමාණය | දැනට සිටින ප්‍රමාණය | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| | | | ස්ථිර | කොන්ත්‍රාත් | |
| 24 | සැලසුම් සහකාර (පර්යේෂණ) | 01 | 01 | - | |
| 25 | සැලසුම් සහකාර (සංඛ්‍යාන) | 01 | 01 | - | |
| 26 | නීති සහකාර | 01 | - | - | 01 |
| 27 | ප්‍රජා සංවර්ධන සහකාර | 30 | 17 | - | 13 |
| 28 | තාක්ෂණික සහකාර | 12 | 10 | - | 03 |
| 29 | සැලසුම් ශිල්පී | 01 | 01 | - | |
| 30 | ක්‍රමලේඛක | 01 | 01 | - | |
| 31 | කළමනාකරණ සහකාර (තා.නො.) | 20 | 27 | 02 | 01 |
| 32 | දත්ත සටහන් ක්‍රියාකරු | 02 | 02 | - | |
| 33 | සමාජ සංවර්ධන සහකාර | 20 | 10 | - | 10 |
| 34 | රියදුරු | 10 | 11 | - | |
| 35 | ප්‍රාථමික ශිල්පීය නොවන /කාර්යාල කාර්ය සහායක | 09 | 13 | - | |
| 36 | ලේඛන භාරකරු | 01 | 01 | - | |
| 37 | ගබඩා භාරකාර සහායක | 01 | 01 | - | |
| 38 | ඉදිකිරීම් අධීක්ෂණ සහායක (කොන්ත්‍රාත්) | 16 | | 15 | 01 |
| | **එකතුව** | **158** | **116** | **17** | **41** |

# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

මනා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදයක් පවතින බව සහතික කිරීම සඳහා සහ කළමනාකරණයට සහ අදාළ බලධාරීන්ට නිවැරදි, යෝග්‍ය සහ කාලීන වූ තොරතුරු සපයා දීමට හැකිවන පරිදි, එය හොඳින් කළමනාකරණය කෙරෙන බව සහතික කිරීම සඳහාත්, නීති සහ අධිකාරියේ ප්‍රතිපත්තිවලට සහ ව්‍යවස්ථාපිත සහ සංස්ථාපිත පාලනයන්ට අනුකූල වන පරිදි ගිණුම්කරණ සහ අභ්‍යන්තර පාලන කළමනාකරණය කිරීම සඳහාත්, සමාලෝචනය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ බලතල විගණන කමිටුවට පැවරී තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත සහ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුගෙන් (02) විගණන කමිටුව සමන්විත විය. රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - ප්‍රසම්පාදන අධීක්ෂණ ඒකකය, එම්.කේ. ප්‍රදීප් කුමාර මහතා 2018 වර්ෂයේ කමිටු සභාපති ලෙස කටයුතු කළේය. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වන ආචාර්ය මහීම් මෙන්ඩිස් සහ ඒ.කේ.පී. විජිත් චන්දිම යන මහත්වරු කමිටු සාමාජිකයින් ලෙස කටයුතු කළහ.

රජයේ විගණන අධිකාරී සහ රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක, නිරීක්ෂකයන් ලෙස විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලට සහභාගි වූ අතර, අවශ්‍ය පරිදි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අංශ ප්‍රධානීන් හා අවශ්‍ය අවස්ථාවන්හි දී අනෙකුත් නිලධාරීන් රැස්වීම්වලට සහභාගි විය. අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්; කමිටුවේ ලේකම් ලෙස කටයුතු කළේය. අභ්‍යන්තර විගණක විසින් සකස් කරන ලද 2018 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම කමිටුව විසින් සලකා බලා අනුමත කරන ලදි.

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව රැස්වීම් වාර 03 ක් පවත්වා ඇත. විගණන වාර්තා, විගණන විමසුම්වලට අදාළ ගැටළු සහ පිළිතුරු, අභ්‍යන්තර හා බාහිර විගණනයන් හි නිරීක්ෂණ, අභ්‍යන්තර පාලන පද්ධතීන් මෙන්ම වාර්ෂික වාර්තාව නිසිකලට සකස් කර ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීම ද ඇතුළත්ව වැඩි දියුණු කිරීම් අවශ්‍ය අනෙකුත් ක්ෂේත්‍ර පිළිබඳව කමිටුව සාකච්ඡා කරන ලදි. අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, ගනු ලැබූ තීරණවලට අදාළ පසු විපරම් ක්‍රියාමාර්ග ද සාකච්ඡා කරන ලදි. සාකච්ඡා කරන ලද ප්‍රමුඛ කරුණු ඇතුළත් රැස්වීම් සාකච්ඡා සටහන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන ලදි.

සාමාජිකයින් සහ නිලධාරීන් විසින් ලබාදුන් වටිනා දායකත්වය මෙන්ම විශේෂයෙන්ම විගණන ක්‍රියාවලියේ දී විගණකාධිපති විසින් ලබාදුන් ඉතා වටිනා නිරීක්ෂණයන් ද මම අවංකවම ඉතා අගය කොට සළකමි.

විගණන හා කළමනාකරණ කමිටුවේ අණ පරිදි,

විගණන හා කළමනාකරණ කමිටු ලේකම්,

**අධ්‍යක්ෂ ජනරාල්**

*නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය*

# ක්‍රියාත්මක වැඩසටහන් | 2018

# භෞතික සංවර්ධන වැඩසටහන


LUNAWA


# ලුනාව නිවාස ව්‍යාපෘතිය



අඩු පහසුකම් නාගරික ප්‍රජාව සඳහා නිවාස විසඳුම් ලබාදීමේ අරමුණින්, මොරටුව ලුනාව තානායම් ඉඩමෙහි මහල් 12 කින් (G+11)යුතු, නිවාස ඒකක 356 කින් සමන්විත, රු.මිලි.1,369.316ක මූල්‍ය ඇස්තමේන්තුවක් සහිතව ලුනාව නිවාස ව්‍යාපෘතිය ඉදිකිරීම් සඳහා සැලසුම් කරන ලදි. ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිකිරීම් භාරව කටයුතු කරන අතර, ව්‍යාපෘති කළමනාකරණය; රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව විසින් සිදු කරනු ලබයි.

සියලු පහසුකම් සහිත මනා නේවාසික පරිසරයක් ව්‍යාපෘති භූමිය තුල ස්ථාපිත කිරීම සඳහා ගොඩනැගිලිවල පහළ වාණිජ්‍යය සේවා ස්ථාන, විනෝද ස්ථාන, ප්‍රජා ශාලාවකින් සමන්විත ලෙස ඉදිකිරීම්, රථ වාහන ගාල්කිරීමේ පහසුකම්, ගෙමිදුල සැකසීම, රුක් රෝපණය හා පිවිසුම් දොරටුව ඇතුළුව මායිම් තාප්පය ඉදිකිරීම, මලාපවාහන පද්ධතිය මුහුදට සම්බන්ධ කිරීම යන අමතර වැඩ-කොටස් ව්‍යාපෘතිය සඳහා අලුතින් එක් කරන ලද අතර, ඒ අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ද සංශෝධනය විය.

සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුව අවශ්‍ය අනුමැතීන් සඳහා ඉදිරිපත් කර ඇති අතර, ඒ අනුව ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන් නිමකර ජනතා අයිතියට පත්කිරීම 2019 වර්ෂයේ දී සිදු කිරීමට නියමිතව ඇත.




මහනුවර මහයියාව නිවාස ව්‍යාපෘතිය, 'MC ජනාවාසය' ඇතුළු මහනුවර නගරයේ ජීවත් වන අඩු ආදායම්ලාභී ප්‍රජාව ප්‍රතිනිවාසකරණය සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සැලසුම් කරන ලද නිවාස ව්‍යාපෘතියක් වන අතර, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත නිවාස ව්‍යාපෘතියකි.

ඉහත සංකල්පීය සංවර්ධන සැලැස්ම මගින් මහනුවර - මහයියාව හි අක්කර 14 ක ඉඩම් කැබැල්ල සඳහා නිර්මාණය කර ඇති නිර්දේශිත ඉඩම් පරිහරණ වර්ග පෙන්වයි.

# ක්‍රියාත්මක වැඩසටහන් | 2018

# මානව සංවර්ධන වැඩසටහන

## “ස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහන

2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරී පනතින් පැවරුණ කාර්යභාරයක් ලෙස ඌන පහසුකම් සහිත නාගරික ජනාවාසයන් හි ජීවත් වන ප්‍රජාවගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික ප්‍රවර්ධනය උදෙසා එම ප්‍රජාව බලගැන්වීම මෙන්ම ඔවුන්ගේ දරුදැරියන්ගේ දැනුම, කුසලතා හා ආකල්පමය වශයෙන් ධනාත්මක ප්‍රවේශයකට යොමු කිරීම උදෙසා “ස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහන නාගරික ජනාවාස මට්ටමින් ක්‍රියාවට නැංවීමේ වගකීම මෙම අධිකාරියට පවරා ඇත.

උක්ත කාර්යයන් ක්‍රියාවට නැංවීම සඳහා “ස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහන යටතේ පහත ක්‍රියාකාරකම් නාගරික ජනාවාස මට්ටමින් ඉටු කරන ලදි.

1* ප්‍රජාව සංවිධානගත කිරීම හා බලගැන්වීම

2* ළමා කුසලතා ප්‍රවර්ධන වැඩසටහන්

3* තරුණ කුසලතා ප්‍රවර්ධන වැඩසටහන්

4* ව්‍යවසායකත්ව හා ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන්

5* පොදු ප්‍රජා ක්‍රියාකාරී වැඩසටහන්

ඒ අනුව, නාගරික ජනාවාස වැසියන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා, “ස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහන වර්ෂ 2011 දී ආරම්භ කරන ලද අතර, 2018 වර්ෂය තුළ ද මේ යටතේ මූලික අරමුණු ඉටුකර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

## 01 ප්‍රජාව සංවිධාගත කිරීම හා බලගැන්වීම

### 1.1 නාගරික බල ප්‍රදේශයන් ආවරණය කරමින් නව ජනාවාසයන් හඳුනාගැනීම, සමාජ - ආර්ථික සමීක්ෂණ කටයුතු සිදු කිරීම, පවුල් දැනුවත් කිරීම, “ස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

“ස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහන යටතේ පවුල් ලියාපදිංචිය හා තොරතුරු ලබා ගැනීම නව ජනාවාසයන් හි සිදුකළ අතර, එහි දී “ස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහනේ අරමුණු සහ ක්‍රියාකාරකම් පිළිබඳව ජනාවාස ප්‍රජාව දැනුම්වත් කිරීම සිදු කරන ලදි.

කොළඹ නාගරික කලාපය තුළ හා පිට පළාත් හි, “ස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහන ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන්නේ, එම ප්‍රජාව තුළින්ම හඳුනාගන්නා ලද ක්‍රියාකාරී ප්‍රජා නායකයින්ගේ සහභාගීත්වයෙනි. 2018 වර්ෂයේ දී එවැනි ක්‍රියාකාරී ප්‍රජා නායකයින් 1700 ක් පමණ හඳුනාගෙන ඇත. එසේම කොළඹ නාගරික කලාපය තුළ හා පිටත නාගරික කලාපයන් ආවරණය වන පරිදි සමාජ - ආර්ථික සමීක්ෂණයන් 46 ක් සිදු කර ඇත.



*සමාජ සජීවීකරණ අංශයේ ක්ෂේත්‍ර නිලධාරීන් විසින් සමීක්ෂණ කටයුතු සිදුකරන අයුරු*



*නිවාසයන් හි භෞතික තත්ත්වය*

## 1.2 "ස්වශක්ති" ප්‍රජා මූල සංවිධාන ස්ථාපිත කිරීම හා යාවත්කාලීන කිරීම

*කොළඹ නාගරික කලාපය තුළ හා පිට පළාත් හි ප්‍රජාමූල සංවිධාන ස්ථාපිත කිරීම හා යාවත්කාලීන කිරීම*

තම ජනාවාසයේ උන්නතිය උදෙසා එක්ව කටයුතු කිරීමේ වැදගත්කම හා වටිනාකම ප්‍රජා මූල සංවිධාන තුළින් විශද වන්නා වූ කරුණකි. ජනාවාස ප්‍රජාවන්ට පැමිණෙන්නා වූ නොයෙකුත් අභියෝගයන්ට මුහුණ දීමේ මූලික ශක්‍යතාව ප්‍රජාමූල සංවිධාන තුළින් ඇති කරනු ලබයි.

මෙම අරමුණු ඔස්සේ යමින් කොළඹ නාගරික කලාපය තුළ හා පිට පළාත් හි ප්‍රජා මූල සංවිධාන 240 ක් පිහිටුවීම හා යාවත්කාලීන කිරීම සිදු කර ඇති අතර, ප්‍රජාමූල සංවිධාන 67 ක් ලියාපදිංචි කර ඇත.





හොරණ රොස්වුඩ්වත්ත නිවාස ප්‍රතිලාභීන් සමග ඔවුන්ගේ නිවාසයන් ඉදිකිරීම සම්බන්ධයෙන් හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රැස්වීමක් පවත්වන ලදි. මේ සඳහා අප අධිකාරියේ සභාපතිතුමන්, හොරණ නගරාධිපති, උප සභාපතිනිය, කළුතර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නිලධාරීන් ද සහභාගී විය.



## 1.3 ප්‍රජා ක්‍රියාකාරී වැඩමුළු පැවැත්වීම (CAP Workshop)

කිසිදු රාජ්‍ය ආයතනයක හෝ වෙනත් වගකිව යුතු ආයතනයක මැදිහත් වීමක්, උපකාරයක් නොමැති ජනාවාසයන් හි ප්‍රජාව කෙරෙහි වූ, ඔවුන්ට පමණක් විසඳාගත නොහැකි ගැටලු සම්බන්ධයෙන් විසඳුම් සෙවීමේ අරමුණින් රාජ්‍ය නිලධාරීන්, ප්‍රජා නායකයින් හා ජනාවාස ප්‍රජාව සම්බන්ධ කරගනිමින් ප්‍රජා ක්‍රියාකාරී වැඩමුළු කොළඹ නාගරිකයේ ජනාවාස මුල් කර ගනිමින් හා පිටත නාගරික කලාපයන් හි මානව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක නිවාස ව්‍යාපෘතීන් හි ක්‍රියාත්මක කර ඇත.

ඒ අනුව, කොළඹ නාගරික කලාපයන් ආවරණය කරමින් ප්‍රජා ක්‍රියාකාරී වැඩමුළු ක්‍රියාත්මක කළ අතර, ඒ තුළින් ජනාවාස ප්‍රජාවන් අත්කරගත් ප්‍රතිලාභයන් ද බොහෝ ය.





*ප්‍රජාව විසින් තම ජනාවාසයේ පවතින ගැටලු සටහන් කරමින්*

# 02 ළමා කුසලතා, ආකල්ප ප්‍රවර්ධන වැඩසටහන

## 2.1 2018 ලෝක ජනාවාස දිනට සමගාමීව පැවැත්වූ තරගයන් හි ජයග්‍රාහකයින් වෙනුවෙන් ත්‍යාග, කුසලාන හා සහතිකපත් ප්‍රදානය

2017 ලෝක ජනාවාස දිනට සමගාමීව පැවැත්වූ ළමා සිතුවම්, ළමා කෙටි නාට්‍ය තරගාවලීන් හි දෙවන, තෙවන ස්ථාන ලබාගත් හා කුසලතා දැක්වූ ළමුන් වෙනුවෙන් තිළිණ, සහතිකපත්, කුසලාන ප්‍රදානය ගරු නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ මැතිනිය වන ජලනි ප්‍රේමදාස මැතිනියගේ ප්‍රධානත්වයෙන් හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්, සම්භාවනීය ආරාධිත අමුත්තන්ගේ සහභාගීත්වයෙන් 2018.03.17 වන දින මාලිගාවත්ත ප්‍රදීපා ශාලාවේ දී උත්සවකාරයෙන් පැවැත්විණි.





*2017 ලෝක ජනාවාස දිනයට සමගාමීව පැවති තරගාවලීන් හි ජයග්‍රාහී ළමුන් සඳහා සහතිකපත් හා කුසලාන ජලනි ප්‍රේමදාස මැතිනියගේ සුරතින් පිරිනැමීම*

## 2.2 2018 ලෝක ජනාවාස දින සැමරුම වෙනුවෙන් පවත්වනු ලැබූ ළමා සිතුවම් තරගාවලියෙ හි පළමු අදියර ජනාවාස මට්ටමින් පැවැත්වීම

ළමුන් තුළ සැඟවුණු නිර්මාණ කෞශල්‍යයන් ඔප්නංවාගැනීමට ලෝක ජනාවාස දින ළමා සිතුවම්කරණ වැඩසටහන කදිම තෝතැන්නක් බව පෙන්වා දෙමින් 2018 වර්ෂයේදී ද කොළඹ නාගරික කලාපය තුළ හා මානව සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කොළඹින් පිටත නිවාස ව්‍යාපෘතීන් හි ළමුන් ඒකරාශී කරගනිමින් සිතුවම්කරණයේ මූලික වටයේ තරග ජනාවාස මට්ටමින් පැවැත්විණි. මූලික වටයේ තරග සඳහා ළමුන් 11,450 ක් සහභාගී විය.



සිතුවම් තරගය සඳහා පැමිණි ළමුන්ගේ ලියාපදිංචිය සිදු කරමින්



ළමුන් සිතුවම්කරණයේ යෙදෙමින්



ජනාවාස මට්ටමින් පැවති පළමු අදියරේ ළමා සිතුවම් අතරින්, කොළඹ නාගරික කලාපයේ හා මානව සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කොළඹින් බැහැර කලාපයන් හි දක්ෂ ලෙස සිතුවම්කරණයේ යෙදුණු ළමුන් 3,000 ක් සම්බන්ධ කරගනිමින් අවසන් අදියරේ තරග 2018.09.22 වන දින විහාරමහා දේවී උද්‍යානයේ දී විචිත්‍රවත් ලෙස පැවැත්විණි. ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් මගින් ජයග්‍රාහී සිතුවම් තෝරාගැනීම ද එදින ම සිදු කරන ලදි.





*විහාරමහාදේවී උද්‍යානයේ පැවති අවසන් අදියරේ ළමා සිතුවම් තරගයේ සමාප්තියෙන් පසුව ජයග්‍රාහී සිතුවම් තෝරාගැනීම සඳහා විනිශ්චයට යොමු වෙමින්*

## 2.3 කුරුණෑගල - නිකවැරටිය ළමා සිතුවම් තරගය

නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍ය ගරු ඉන්දික බණ්ඩාරනායක මැතිතුමාගේ හා අමාත්‍යාංශ ලේකම්තුමාගේ සහභාගීත්වයෙන් කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී පැවති සාකච්ඡාවේ දී ඉදිරිපත් වූ අදහසක් අනුව නිකවැරටිය අධ්‍යාපන කලාපයේ පාසල් සිසුන් 500 කගේ පමණ සහභාගීත්වයෙන් ළමා සිතුවම් තරගයක් 2018.09.22 වන දින නික/වාරි/ ඥානෝදය මධ්‍යමහා විද්‍යාලයේ දී පවත්වන ලදි.





## 2.4 2018 ලෝක ජනාවාස දින සැමරුම වෙනුවෙන් ළමා කෙටි නාට්‍ය තරගාවලිය

2018 ලෝක ජනාවාස දින සැමරුමට සමගාමීව ජනාවාස දූදරුවන් ඒකරාශී කරගනිමින් පවත්වන ''ස්වශක්ති'' ළමා කෙටි නාට්‍ය තරගාවලියේ දී ළමුන් විසින් ඉදිරිපත් කරන නාට්‍යයන් හි, ගුණාත්මක බව හා නිර්මාණශීලීත්වය වැඩිදියුණු කිරීම උදෙසා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් සම්බන්ධ කරගනිමින්, ළමුන්ට පුහුණුවීම් වැඩමුළු ජනාවාසයන් තුළ පවත්වන ලදි.





*''ස්වශක්ති'' ළමා කෙටි නාට්‍ය පෙර පුහුණුවීම්*

2018 ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් පවත්වන ලද ළමා කෙටි නාට්‍ය තරගාවලියේ පළමු වටය 2018.08.23 හා 24 දෙදින මාලිගාවත්ත ප්‍රදීපා ශාලාවේ දී රඟදැක්වූ අතර, ඒ සඳහා නාට්‍ය 48 ක් ඉදිරිපත් කරන ලදි. ජනාවාස දරුදැරියන්ගේ ස්වයං නිර්මාණයන් හි කෞෂල්‍යයන් එම නිර්මාණයන් තුළින් දැකගත හැකි විය. ළමා කෙටි නාට්‍ය තරගාවලියේ අවසන් වටය ගරු නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ මැතිනිය ඇතුළු සම්භාවනීය අමුත්තන්ගේ ප්‍රධානත්වයෙන් 2018.09.08 වන දින මාලිගාවත්ත ප්‍රදීපා ශාලාවේ දී පැවැත් වූ අතර, ඒ සඳහා කුසලතාවයකින් යුතු නාට්‍ය 20 ක් තෝරාගන්නා ලදි.



*ජලනි ප්‍රේමදාස මැතිනිය විසින් වැඩසටහන ආරම්භයට පෙර පොල්තෙල් පහන් සිළු දල්වමින්*



*ළමුන් තම රංගන ප්‍රතිභාවන් එළිදක්වමින්*

**හොඳම නළුවා**



**ටී.ජී. ඉන්ද්‍රජිත් නන්දිවර්ධන**

**හොඳම නිළිය**



**කේ. පබෝධි දේවිකා**

## ළමා කෙටි නාට්‍ය තරගාවලියේ ජයග්‍රාහක නාට්‍ය කණ්ඩායම්



**ප්‍රථම ස්ථානය**

“සුරපුරය ” ළමා කෙටි නාට්‍යය



**දෙවන ස්ථානය**

“පිය සෙනෙහස ” ළමා කෙටි නාට්‍යය



**තෙවන ස්ථානය**

“දිළිඳුකම දුරලමු ” ළමා කෙටි නාට්‍යය

## 2.5 2018 ලෝක ජනාවාස දිනට සමගාමීව පැවැත්වූ තරගයන් හි ජයග්‍රාහකයින් වෙනුවෙන් ත්‍යාග, කුසලාන හා සහතිකපත් ප්‍රදානය - ලෝක ජනාවාස දින ජාතික සැමරුම් උත්සවය

2018 ලෝක ජනාවාස දිනයට සමගාමීව පැවැත්වූ ළමා සිතුවම්, ළමා කෙටි නාට්‍ය තරගාවලීන් හි ප්‍රථම ස්ථාන ලබාගත් ළමුන් සඳහා තිළිණ, සහතිකපත්, කුසලාන ප්‍රදානය 2018.10.01 වන සඳු දිනට යෙදුණු ලෝක ජනාවාස දින ජාතික උත්සව වේදිකාවේ දී සිදු කෙරිණි. ගරු නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා සම්භාවනීය ආරාධිත අමුත්තන්ගේ සහභාගීත්වයෙන් පැවති මෙම උත්සවයට සමගාමීව කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොටවෙහෙර "ජගත් නිවහන්ගම" ආදර්ශ ගම්මානය ජනතා අයිතියට පත්කිරීම ද සිදු විය.






*ගරු නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් ජයග්‍රාහකයින් හට සහතිකපත් හා තිළිණ ප්‍රදානය*

## 2.6 හම්බන්තොට - සූරියවැව අධ්‍යාපන කලාපයේ පැවති ළමා සිතුවම් තරගය

127 වන ආදර්ශ ගම්මානය වන හම්බන්තොට සූරියවැව "මහාමාන්‍ය ඩී.එස්. සේනානායකගම" ආදර්ශ ගම්මානය ජනතා අයිතියට පත්කිරීමට සමගාමීව, සූරියවැව අධ්‍යාපන කලාපයේ පාසල් ළමුන් අතර සිතුවම් හා රචනා තරගයක් පැවැත්වීමෙන් අනතුරුව ජයග්‍රාහකයින් සඳහා සහතිකපත් හා තිළිණ ප්‍රදානය සිදු විය.





*සිතුවම් හා රචනා තරගයේ ජයග්‍රාහකයින් හට ගරු අග්‍රාමාත්‍යතුමා අතින් සහතිකපත් හා තිළිණ ප්‍රදානය*

## 2.7 නාගරික ජනාවාසයන් හි වෙසෙන ළමුන්ගේ දැනුම, කුසලතා හා ධනාත්මක ආකල්ප ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් මහවැලි කේන්ද්‍රයේ දී පැවැත්වීම

2018 ලෝක ජනාවාස දිනය අරමුණු කරගනිමින් නාගරික ජනාවාසයන් හි වෙසෙන ළමුන්ගේ දැනුම, කුසලතා හා ධනාත්මක ආකල්ප ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් වැඩසටහනක් 2018.08.15 වන දින ළමුන් 220කගේ සහභාගීත්වයෙන් මහවැලි කේන්ද්‍ර ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.

ජාතික තරුණ සේවා සභාවේ සම්පත්දායකයින් හා බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනයේ සම්පත්දායකයින් මෙහි දී දායකත්වය ලබාදෙන ලදි.





*ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් ළමුන් හා සම්බන්ධ වෙමින්*

### 2.8 2018 වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්වයට පෙනී සිටින ළමුන්ගේ මානසිකත්ව ප්‍රවර්ධන වැඩමුළුවක් පැවැත්වීම

ප්‍රවීණ මානව හැකියා ප්‍රවර්ධන විශේෂඥ සනත් ගමගේ මහතාගේ සම්පත් දායකත්වයෙන්, 5 වසර ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටීමට නියමිත, නාගරික අඩු පහසුකම් ජනාවාස දුවාදරුවන් 200 කගේ සහභාගීත්වයෙන්, 2018.05.05 වන දින කොළඹ නව නගර ශාලාවේ දී සහ හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පාසල් ළමුන් 250 කට ආසන්න ප්‍රමාණයකගේ සහභාගීත්වයෙන් 2018.06.09 වන දින හම්බන්තොට සිංගප්පූරු ප්‍රජා සත්කාරක මධ්‍යස්ථානයේ දී ශිෂ්‍යත්ව වැඩමුළු පැවැතවන ලදි.

ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලීන් සම්බන්ධයෙන් ඉතා වැදගත් ප්‍රායෝගික හා න්‍යායාත්මක කරුණුවලින් යුත් දේශනයකින් ළමුන් හා ඔවුන්ගේ දෙමාපියන් දැනුවත් කිරීමට හැකි විය.



*සනත් ගමගේ මහතා විසින් දේශනයන් හා සාකච්ඡා මගින් ළමුන් දැනුවත් කරමින්*



*ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් මානව හැකියා දියුණු කළ හැකි අයුරු පෙන්වා දෙමින්*

### 2.9 ළමා නායකත්ව කුසලතා ධනාත්මක ආකල්ප ප්‍රවර්ධනය ක්‍රියාකාරීත්වය ඇති කරනු වස් ළමා සමිති පිහිටුවීම හා යාවත්කාලීන කිරීම.

ජනාවාස ළමුන්හට තම දක්ෂතා, කුසලතා හා ආකල්ප එළිදැක්වීමේ තෝතැන්නක් ලෙස ළමුන් ඒකරාශී කරගනිමින් පිහිටුවාගන්නා ළමා සමිතිය දැක්විය හැකිය. ළමුන් තුළ පවත්නා සැඟවුණු දක්ෂතා කරලියට ගෙන එමින්, එම ළමුන්ගේ හැකියාවන් සඳහා වටිනාකමක් ලබාදීම ළමා සමිති මගින් සිදු වනු ඇත.

එහි දී මනෝවිද්‍යාත්මක ක්‍රමවේදයන් ඔස්සේ කොළඹ නාගරික කලාපය තුළ හා මානව සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක පිටත නාගරික කලාපයන් හි ළමා සමිති 289 ක් පිහිටුවීම හා යාවත්කාලීන කිරීම සිදු කරන ලදි.



*ළමා සමිතියේ ළමුන් විසින් කුසලතාවන් එළිදක්වමින්*



*ලෝක ජනාවාස දින තරගයන් හි කුසලතා දැක්වූ ළමුන් හට ළමා සමිතිහි දී සහතිකපත් ලබාදීම*

## 2.10 2018 ලෝක ජනාවාස දිනට සමගාමීව ළමා දන්ත සායන පැවැත්වීම

ජනාවාස ළමුන්ගේ මුඛ සෞඛ්‍ය ආරක්ෂිතව පවත්වා ගැනීම උදෙසා ජනාවාස ළමුන් වෙනුවෙන් වෛද්‍ය සායන පවත්වනු ලබයි. ඒ යටතේ මාලිගාවත්ත දන්ත වෛද්‍ය ආයතනය හා එක්ව බොරැල්ල කලාපයට අයත් දෙමටගොඩ ඥානවිමල බෝධිරාජ ධර්මායතනයේ දී, 2018.08.13 වන දින ළමුන් 83 කගේ සහභාගීත්වයෙන් සහ නැගෙනහිර /බටහිර කලාපයට අයත් කිතුල්වත්ත ජනාවාසයේ 50කට අධික දූදරුවන්ගේ සහභාගීත්වයෙන් 2018.05.05 දින දන්ත වෛද්‍ය සායන පවත්වන ලදි.





## 2.11 ළමා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

කුඩා කල සිට ම දරුවන්ට ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක වැඩසටහනක් ලෙස, ළමා ඉතුරුම් වැඩසටහන දැක්විය හැකිය. ලංකා බැංකුව හා එක්ව කොළඹ නාගරික කලාපය තුළ මෙන්ම මානව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කොළඹ නාගරික කලාපයෙන් පිටත නාගරික නිවාස ව්‍යාපෘතීන් හි ද, වර්ෂය පුරා ක්‍රියාත්මක මෙම වැඩසටහන මගින් එක් ළමයෙකු සඳහා රු. 100.00 ක දායකත්වයක් අධිකාරිය මගින් දරන අතර, ලංකා බැංකුව මගින් ද එක් දරුවෙකු සඳහා රු. 100.00 ක දායකත්වයක් දරයි.



## 2.12 ජනාවාස ළමුන් සඳහා උපකාරක පංති පැවැත්වීම

විවිධ ආර්ථික දුෂ්කරතා හේතුවෙන් විධිමත් ලෙස පාසල් අධ්‍යාපනය ලැබීමේ හැකියාවක් නොමැති දරුවන් බොහෝමයක් මානව සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක ජනාවාසයන් හි වෙසෙන අතර,මූලික සාක්ෂරතාවය පවා නොමැති දරුවන් ද මේ අතර සිටී. කිසිවෙකුගේ අවධානයක් නොමැති මෙම ළමුන් වෙනුවෙන්, අප අධිකාරියේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මැදිහත්වීමෙන් කොළඹ නාගරික කලාපයට අයත් ජනාවාසයන් හි උපකාරක පංති වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර, බොහෝමයක් ළමුන් ඊට උනන්දුවෙන් යුතුව සහභාගී විය.





## 2.13 ආගමික වැඩසටහන් සංවිධානය

කුඩා කල සිට ම ළමුන් ආගමික නැඹුරුවකින් ජීවත් වීමට පුරුදු පුහුණු කිරීම දෙමාපියන් සතු වගකීමක් මෙන්ම යුතුකමක් ද වන්නේය. එවන් පරිසරයකින් මිදුණු ළමුන් නොයෙකුත් අපරාධ හා අපචාරයන්ට යොමු වීම ජනාවාසයන් තුළ සුලභව දක්නට ලැබෙන කාරණයකි.

අතළොස්සක් ජනාවාස දරුවන් ආගමික නැඹුරුවකින් යුතුව හා මනා හික්මීමකින් මෙන්ම සංහිඳියාවකින් යුතුව සිටිනු දක්නට ලැබීම ද සජීවීකරණයේ ධනාත්මක ප්‍රතිඵලයකි. මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා, පිළියන්දල - කැස්බෑව විශ්වකලාව ළමා සමිතිය මගින් ආශිර්වාද පහන් පිංකමක් පැවැත්වීම 2018.07.27 දින ජනාවාසයේ ළමුන්ගේ හා එම ප්‍රජාවගේ දායකත්වයෙන් සිදු කරන ලදි.



නැගෙනහිර / බටහිර කොළඹ කලාපයට අයත් 60 ටොරින්ටන් ජනාවාසයේ ළමා සමිතිය මගින් මල් පෙරහැරක් පවත්වන ලදි.



# 03 තරුණ කුසලතා ප්‍රවර්ධන වැඩසටහන්

## 3.1 2018 ලෝක ජනාවාස දිනට සමගාමීව නාගරික ජනාවාස තරුණියන් සඳහා එක්දින රූපලාවන්‍ය පුහුණු වැඩුමුළුවක් පැවැත්වීම

රූපලාවන්‍ය ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන හා එම ක්ෂේත්‍රය තුළ තම වෘත්තීය ජීවිතය සකස් කරගත් කොළඹ නාගරික තරුණ ප්‍රජාව වෙනුවෙන් එක්දින පුහුණු වැඩමුළුවක් 2018.09.09 වන දින කොළඹ 07 හි පිහිටි ෂෙරී ගුණරත්න ඇකඩමියෙ හි පැවැත්වීමට කටයුතු කළ අතර, තරුණ තරුණියන් 41 දෙනෙකුට රූපලාවන්‍ය ක්ෂේත්‍රය පිළිබඳ නවමු අත්දැකීම් සම්භාරයක් අත්කරගැනීමට එහි දී හැකි විය.





*ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් වැඩමුළුව සඳහා සහභාගී වූවන් දැනුවත් කරමින්*

## 3.2 2018 ලෝක ජනාවාස දිනය අරමුණු කරගනිමින් තරුණ නායකත්ව කුසලතා හා පෞරුෂත්ව පුහුණු වැඩුමුළුවක් පැවැත්වීම

කොළඹ නාගරික කලාපය තුළ වෙසෙන තරුණ ප්‍රජාවගේ නායකත්ව කුසලතා, ආකල්ප ප්‍රවර්ධනය හා පෞරුෂත්ව සංවර්ධනය මූලික කරගනිමින් ජාතික ශිෂ්‍යභට බලකාය හා ඒකාබද්ධව 2018.08.12 වන දින කොළඹ විහාරමහාදේවී උද්‍යානයේ දී නායකත්ව කුසලතා හා පෞරුෂත්ව පුහුණු වැඩමුළුවක් සංවිධානය කළ අතර, එහි දී තරුණ තරුණියන් ඉතා උද්‍යෝගීව හා උනන්දුවෙන් යුතුව ක්‍රියාකාරකම් හි නිරතවනු දක්නට ලැබුණි. මෙම වැඩසටහන සඳහා ළමුන් 32 නෙකු සම්බන්ධ විය.



*ජාතික ශිෂ්‍යභට බලකායේ නිලධාරී මහතෙකු විසින් වැඩසටහන පිළිබඳ කෙටි හැඳින්වීමක් සිදුකරමින්*



*තරුණ තරුණියන් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නිරත වෙමින්*

### 3.3 තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

විද්වත් වෘත්තිකයන්ගේ සංගමය, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, ගාල්ල කාර්මික විද්‍යාලය හා ඒකාබද්ධව 2018.07.29 වන දින,තරුණ තරුණියන් 118කගේ සහභාගීත්වයෙන් නිවාස ඉදිකිරීම් සම්බන්ධයෙන් හා වෘත්තීය පුහුණු අවස්ථාවන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් ගාල්ල කාර්මික විද්‍යාලයේ දී පවත්වන ලදි.

විද්වත් වෘත්තිකයන්ගේ සංගමය, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, බලපිටිය කාර්මික විද්‍යාලය හා ඒකාබද්ධව, 2018.08.26 වන දින තරුණ තරුණියන් 120කගේ සහභාගීත්වයෙන් නිවාස ඉදිකිරීම් සම්බන්ධයෙන් හා වෘත්තීය පුහුණු අවස්ථාවන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් බලපිටිය කාර්මික විද්‍යාලයේ දී පවත්වන ලදි.





## 04 ව්‍යවසායකත්ව හා ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන

### 4.1 කුඩා කණ්ඩායම් ස්ථාපිත කිරීම

මූල්‍ය විනයක් හා ඉතුරුම් සංස්කෘතියක් බිහිකිරීමට ප්‍රජාව හුරුකරවීම තුළින් කුටුම්භ ආර්ථිකය ගොඩනගාගැනීම උදෙසා, කුඩා කණ්ඩායම් ක්‍රමය ජනාවාස මට්ටමින් ක්‍රියාත්මක කරන අතර, එහි දී ගොඩනැගෙන අරමුදල ප්‍රජාවගේ ජීවන තත්ත්වය උසස් කරලීමේ ආරම්භක පියවර වේ.
මෙම කණ්ඩායම් සතිපතා රැස්වී සාකච්ඡා පැවැත්වීම තුළින් තම තමන් මුහුණදෙන ගැටලු විමර්ශනය කිරීමටත්, ඒවාට විසඳුම් සොයාගැනීමටත් ඉතා හොඳ පරිසරයක් නිර්මාණය වන අතර, කුඩා කණ්ඩායම් ක්‍රමය ක්‍රියාත්මක ප්‍රජාව අතර මෙයින් ලබාගත් ප්‍රතිලාභයන් ද බොහෝය.

මෙහි දී හඳුනාගනු ලැබූ ස්වයං රැකියා නියුක්තිකයින් 1,700 කගේ පමණ සහභාගීත්වයෙන් කුඩා කණ්ඩායම් 400 ක් පමණ ක්‍රියාත්මකව පවතින අතර, එමගින් හඳුනාගනු ලැබූ ස්වයං රැකියා ණය ආධාර අවශ්‍ය ස්වයං රැකියා නියුක්තිකයින් 206 ක් හඳුනාගෙන ඇත.



*ප්‍රජාව දැනුවත් කරමින්*

## 4.2 "දිරියට දිරියක" ස්වයං රැකියා මූල්‍ය සහාය සේවා සැපයීම හා උපකරණ සහාය ලබාදීම

තම පවුලට ආර්ථිකමය වශයෙන් ශක්තියක් වීම සඳහා කාන්තාවන් බොහෝමයක් ස්වයං රැකියාවන් හි නියුතු වනු ජනාවාසයන් තුළ දක්නට ලැබෙන අතර, එසේ තම පවුලේ ආර්ථිකය නඟාසිටුවීම සඳහා කැපවන්නා වූ කාන්තාවන් හට "ස්වශක්ති කාන්තා සවිය" වැඩසටහන යටතේ සහනදායී ගෙවීමේ පදනම මත මහන මැෂින් ලබාදීම හා රු. 25,000/- ක උපරිමයකට යටත්ව ඉතා සහනදායී පොළී ප්‍රතිශතයක් මත ණය මුදලක් ලබාදීම සිදු කරනු ලබයි.

ඒ අනුව, 2018 වර්ෂය තුළ ස්වයං රැකියාවන් හි නියුතු හා අපේක්ෂිත ප්‍රතිලාභීන් 65 දෙනෙකු සඳහා මහන මැෂින් ලබාදීම සිදු කළ අතර, සහනදායී පොළී අනුපාතයක් මත 74 දෙනෙකු සඳහා ස්වයං රැකියා මූල්‍ය ණය ලබාදීමට කටයුතු කරන ලදි.





*ගරු නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමා විසින් නිවාස ව්‍යාපෘතීන් හි ස්වයං රැකියාවන් හි නියුතුවූවන් වෙත ස්වයං රැකියා ණය හා මහන මැෂින් ප්‍රදානය*

## 4.3 ස්වයං රැකියා පසුවිපරම් කටයුතු

ස්වශක්තියෙන් නැගී සිටින අඩු ආදායම්ලාභී ප්‍රජාව සඳහා ලබාදෙන ලද සහනදායී ස්වයං රැකියා මූල්‍ය ණය හා ගෙවීමේ පදනම මත ලබාදෙන ලද මහන මැෂින්, එම ප්‍රජාව විසින් තම ආර්ථිකය ගොඩනංවාගැනීම උදෙසාම අරමුණු කරගන්නේ ද යන්න හා ජීවන තත්ත්වය තුළ යම් ප්‍රගතියක් අත්කරගෙන ඇතිදැයි සොයා බැලීම සඳහා පසුවිපරම් කටයුතු නිරන්තරයෙන් සිදු කරනු ලබයි.





## 4.4 2018 ලෝක ජනාවාස දිනට සමගාමීව කොළඹ නාගරික කලාපයෙ හි ස්වයං රැකියාලාභීන් වෙනුවෙන් වෙළඳ පොළක් පැවැත්වීම

ස්වශක්තියෙන් නැගී සිටින අඩු ආදායම්ලාභී නාගරික ප්‍රජාව හට අත්වැලක් වෙමින් ඔවුන්ගේ ආර්ථිකය යම්තාක් දුරකට ශක්තිමත් කිරීමේ අරමුණින් ස්වයං රැකියාවන් හි නියුතු නාගරික ප්‍රජාව සම්බන්ධ කරගනිමින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මැදිහත්ව,

ස්වයං රැකියා වෙළඳපොළක් 2018.08.29 වන දින සෙත්සිරිපාය පරිශ්‍රයේ පවත්වන ලදි.





*නා.ජ.සං. අධිකාරියේ සභාපතිතුමන් හා වැ.බ. අධ්‍යක්ෂ ජනරාල්තුමන්ගේ  නිරීක්ෂණයට ව්‍යවසායකයින් ලක්වෙමින්*

## 05 පොදු ප්‍රජා ක්‍රියාකාරී වැඩසටහන්

### 5.1 අක්ෂි පරීක්ෂා කිරීම හා ඇස් කණ්ණාඩි ලබාදීම

දිවයින පුරා ක්‍රියාත්මක "සෑමට සෙවණ" ආදර්ශ ගම්මාන ජනතා අයිතියට පත්කිරීමට සමගාමීව, එම ගම්මානයන් අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරමින් අඩු ආදායම්ලාභී ප්‍රජාව සඳහා නොමිලේ අක්ෂි පරීක්ෂා කිරීමේ සායන 93 ක් පැවැත් වූ අතර, ප්‍රතිලාභීන් 13,336  සඳහා 2018 වර්ෂයේ දී ඇස් කණ්ණාඩි ලබාදීමට කටයුතු කරන ලදි.





*ගරු නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමා විසින් ප්‍රතිලාභීන් වෙත ඇස් කණ්ණාඩි ප්‍රදානය*

### 5.2 ආයුර්වේද වෛද්‍ය සායන පැවැත්වීම

අඩු ආදායම්ලාභී නාගරික ප්‍රජාව සඳහා නොමිලේ වෛද්‍ය සායන පැවැත්වීම සෑම වර්ෂයක් පුරාම සිදු කරන අතර, ඒ අතරින් ආයුර්වේද වෛද්‍ය සායන පැවැත්වීම ප්‍රධාන වේ. බටහිර වෛද්‍ය ක්‍රමයන් තුළින් මෙන්ම පාරම්පරික ආයුර්වේද වෛද්‍ය ක්‍රමයන් තුළින් ද ලබාගත හැකි ප්‍රයෝජනයන් පිළිබඳ ප්‍රජාව තුළ ආකල්පයක් ඇති කිරීම මෙහි අරමුණයි. ඒ අනුව, 2018 ලෝක ජනාවාස දින සැමරුමට සමගාමීව ආයුර්වේද වෛද්‍ය සායන වැඩසටහන් පැවැත්වූ අතර, බස්නාහිර පළාත් ආයුර්වේද වෛද්‍ය ආයතනය, ස්වදේශී ආයුර්වේද වෛද්‍ය ආයතනය හා කොළඹ මහ නගර සභාව ඒකාබද්ධ වෙමින් කොළඹ නාගරික කලාපයන් ආවරණය කරමින් ආයුර්වේද වෛද්‍ය සායන  05 ක් පවත්වන ලදි.





## 5.3 පවුල් සෞඛ්‍ය සායන වැඩසටහන් පැවැත්වීම

2018 ලෝක ජනාවාස දිනය අරමුණු කරගනිමින් කොළඹ නාගරික කලාපයන් ආවරණය වන පරිදි, ශ්‍රී ලංකා පවුල් සෞඛ්‍ය සැලසුම් සංවිධානය සම්බන්ධ කරගනිමින් තරුණ හා වැඩිහිටි කාන්තා ප්‍රජාවගේ ප්‍රජනන සෞඛ්‍ය ඉහළ නැංවීම උදෙසා ප්‍රජනන වෛද්‍ය සායන පවත්වනු ලැබීය.

උතුරු කොළඹ කලාපය කේන්ද්‍ර කරගනිමින් 2018.07.05 වන දින ශ්‍රී වික්‍රමපුර ප්‍රජා ශාලාවේ දී පවුල් සෞඛ්‍ය සායනයක් ශ්‍රී ලංකා පවුල් සෞඛ්‍ය සංවිධානය හා එක්ව පැවැත්වූ අතර, මේ සඳහා ප්‍රජාව නියෝජනය කරමින් 104 දෙනෙකු සහභාගී විය. එහි දී ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ උපදෙස් ලබාදීම, පිළිකා හඳුනාගැනීමේ පරීක්ෂණ සිදු කිරීම, රුධිර පීඩනය හා රුධිරගත සීනි පරීක්ෂා කිරීම ආදී සේවාවන් ප්‍රජාවට ලබාදීමට මෙම සායනය හරහා හැකි විය.

මැද කොළඹ කලාපය කේන්ද්‍ර කරගනිමින් ප්‍රජනන සෞඛ්‍ය සායනයක් 2018.08.11 වන දින, පවුල් සෞඛ්‍ය සංවිධානයෙහි සම්පත් දායකත්වයෙන් නවගම්පුර ප්‍රජා ශාලාවේ දී පැවැත්විය. මෙහි දී කොළඹ මහ නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් චර්ම රෝග හඳුනා ගැනීම, පරීක්ෂාව හා ප්‍රතිකාර සඳහා යොමු කිරීමේ සායනයක් ද පැවැත්විය. මෙහි දී 120 දෙනෙකු ප්‍රතිකාර ලබාගන්නා ලදි.





බොරැල්ල කලාපයට අයත් ඌන පහසුකම් සහිත නාගරික ප්‍රජාව සඳහා පවුල් සෞඛ්‍ය සායනයක්, ශ්‍රී ලංකා පවුල් සෞඛ්‍ය සංවිධානයේ සම්පත් දායකත්වයෙන් 2018.08.12 වන දින ආරාමය පෙදෙස ප්‍රජා ශාලාවේ දී පැවැත්විය. ප්‍රජාව 100 දෙනෙකු මෙහි දී ප්‍රතිකාර සඳහා යොමු විය.










බොරැල්ල කලාපයට අයත් ඌන පහසුකම් සහිත නාගරික ප්‍රජාව සඳහා වකුගඩු රෝග සායනයක්, බස්නාහිර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව හා තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රජා සෞඛ්‍ය ඒකකයේ නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන් 2018.12.13 වන දින ටී 20 ප්‍රජා ශාලාවේ දී පැවැත්වීය. මෙම සායනය සඳහා 60 දෙනෙකු සහභාගී විය.

## 5.4 දන්ත වෛද්‍ය සායන වැඩසටහන් පැවැත්වීම

2018 ලෝක ජනාවාස දිනය අරමුණු කරගනිමින් නාගරික ප්‍රජාවගේ මුඛ සෞඛ්‍ය ඉහළ නැංවීම උදෙසා මාලිගාවත්ත දන්ත වෛද්‍ය ඒකකය හා එක්ව දන්ත සායනයක් 2018.09.11 වන දින කදිරානවත්ත ප්‍රජා ශාලාවේ දී  පවත්වනු ලැබූ අතර, ඊට 54 දෙනෙකු සහභාගී විය.

## 5.5 2018 ලෝක කාන්තා දිනයට සමගාමීව මැද කොළඹ කලාපයේ ගැබිනි මව්වරුන් සඳහා දිවා ආහාරය ලබාදීම හා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම

නවගම්පුර ප්‍රජා ශාලාවේ දී ගැබිනි මව්වරුන් 30 දෙනෙකු සම්බන්ධ කරගනිමින් ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය නංවාලීමේ අරමුණින්, දැනුම්වත් කිරීමේ වැඩසටහනක් 2018.03.08 වන දින පැවැත්වුණු අතර, අප අධිකාරියේ නිලධාරී මහත්ම මහත්මීන්ගේ මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ඇතිව ඔවුන්ට දිවා ආහාරවේලක් ලබාදීමට ද කටයුතු කරන ලදි.මෙහි දී හේමාස් සමූහ ව්‍යාපාරයට අයත් බේබි ෂෙරම් ආයතනය මගින් එම මව්වරුන් වෙත අවශ්‍ය බේබි සබන්, බේබි ක්‍රීම් හා බේබි ක්ලෝන් නොමිලේ ලබාදෙමින් අනුග්‍රාහකත්වය දැක්වීය.









*ගරු නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් ප්‍රජා සමිතිය වෙත පුටු ප්‍රදානය කිරීම*

## 5.6 ප්‍රජා සමිති වෙත පුටු ලබාදීම

ජනාවාසයන්හි පවතින පොදු කටයුත්තක දී රැස්ව සාකච්ඡා කිරීම සඳහා හෝ වෙනයම් අවශ්‍යතාවන් සඳහා නිසි ස්ථානයක් හෝ අසුන් ගැනීමට නිසි පරිදි ආසන නොමැති වීම ජනාවාස ප්‍රජාවට පවතින තවත් එක් ගැටලුවකි. ඊට විසඳුම් වශයෙන් ජනාවාසයේ පවතින ප්‍රජා සමිති හරහා සිදු කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගනිමින් අප අධිකාරිය මගින් එම ප්‍රජා සමිති වෙත නොමිලයේ පුටු ප්‍රදානය කිරීම සිදුකරනු ලබයි.

2018 වර්ෂය තුළ ප්‍රජා සමිති 24 ක් සඳහා පුටු 761 ක් ලබාදීමට කටයුතු කර ඇත.

## 5.7 ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ප්‍රජාව තුළ ආගමික සංහිඳියාව හා මානසික සහනය උදෙසා විවිධ ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. එහි දී අම්පාර - දමන "අරුණපුර ප්‍රජා සුභසාධක සමිතිය" ප්‍රජාව ඒකරාශී වී පිංකම් රැසක් සිදු කරන ලදි. එහි දී බුදුමැදුර සඳහා පිළිමවහන්සේ වැඩමකරවීම, පිරිත් දේශනාමය පිංකමක් හා සංඝයා උදෙසා දානමය පිංකමක් පැවැත්වීම සිදු කරන ලදි.







නා.ජ.සං. අධිකාරියේ නිලධාරිනියක විසින්
සිය දේශනය පවත්වමින්

## 5.8 මානව සංවර්ධන වැඩසටහන හා බාහිර ආයතන සම්බන්ධ වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධම්මික හේරත් මහතාගේ ඉල්ලීම පරිදි, එම විශ්වවිද්‍යාලයේ තුන්වන වසරේ ඉගෙනුම ලබන විද්‍යාර්ථීන් සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක "නාගරික ජනාවාස සංවර්ධන ව්‍යාපෘති" පිළිබඳ දේශනයක් හා ක්ෂේත්‍ර චාරිකාවක් අඟුලාන - සයුරුපුර මහල් නිවාස සංකීර්ණය මූලාශ්‍ර කරගනිමින් 2018.05.18 දින පැවතිණි.

එදින පැවති දේශනයේ දී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධම්මික හේරත් මහතා පවසා සිටියේ කොළඹ නාගරික කලාපය තුළ ඇති නිවාස ව්‍යාපෘතීන්හි තමන් සිදු කළ පර්යේෂණයක් තුළින් අනාවරණය වූ කරුණක් වූයේ, අනෙකුත් නිවාස ව්‍යාපෘතීන් හි ජීවත් වන ජනතාවට සාපේක්ෂව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක නිවාස ව්‍යාපෘතීන් හි ජනතාව සතුටින් සිටින බවයි.

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

## ආදායම් හා වියදම් ගිණුම

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | | සටහන | 2018 | 2017 |
|---|---|---|---|---|
| ආදායම් | | | රුපියල් | රුපියල් |
| | භාණ්ඩාගාර ප්‍රදාන - පුනරාවර්ථන | | 103,650,000.00 | 90,848,450.00 |
| | භාණ්ඩාගාර ප්‍රදාන - මානව සම්පත් වැඩසටහන | | 19,340,000.00 | 20,000,000.00 |
| | පොලී ආදායම් | 13 | 8,175,950.98 | 6,991,619.09 |
| | වෙනත් ආදායම් | 14 | 1,781,345.40 | 7,523,032.35 |
| **ආදායම** | | | **132,947,296.38** | **125,363,101.44** |
| **වියදම්** | | | | |
| **පරිපාලන වියදම්** | | | | |
| | වැටුප් | | 4,355,824.75 | 53,158,043.28 |
| | වැටුප් (කොන්ත්‍රාත් පදනම) | | 3,973,714.16 | - |
| | අතිකාල වියදම් | | 3,217,388.47 | 2,234,178.63 |
| | වෙනත් දීමනා | | 3,201,538.00 | 4,507,701.00 |
| | සේවක දිරිදීමනා | | - | 1,507,500.00 |
| | අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු | | 1,501,200.00 | 1,798,896.00 |
| | ගමන් වියදම් (දේශීය) | | 779,122.19 | 908,070.51 |
| | ගමන් වියදම් (විදේශීය) | | 265,045.37 | 155,611.18 |
| | ලිපිද්‍රව්‍ය | | 2,355,513.80 | 2,887,560.44 |
| | ඉන්ධන | | 5,300,120.73 | 4,525,382.51 |
| | සුභසාධන | | 589,714.30 | 551,577.94 |
| | පුවත්පත් වියදම් | | 49,170.00 | 50,600.00 |
| | මුද්දර | | 402,484.00 | 366,023.00 |
| | උත්සව වියදම් | | 53,000.00 | 340,421.70 |
| | බැංකු ගාස්තු | | 16,245.00 | 34,770.00 |
| | දුරකථන වියදම් | | 1,795,653.90 | 1,993,049.52 |
| | කාර්යාල කුලී | | 14,401,849.32 | 14,386,979.29 |
| | කාර්යාල උපකරණ (අලුත්වැඩියා හා නඩත්තු වියදම්) | | 448,782.77 | 579,058.01 |
| | වාහන (අලුත්වැඩියා හා නඩත්තු වියදම්) | | 2,111,080.21 | 7,753,788.72 |
| | ගොඩනැගිලි (අලුත්වැඩියා හා නඩත්තු වියදම) | | 175,191.00 | 52,075.00 |
| | ලී බඩු (අලුත්වැඩියා හා නඩත්තු වියදම) | | - | 10,240.00 |
| | ගොඩනැගිලි අලුත්වැඩියා | | - | 693,093.13 |
| | රක්ෂණය | | 772,086.91 | 690,301.58 |
| | පිරිසිදු කිරීමේ වියදම් | | 1,093,433.55 | 952,766.81 |
| | පුහුණු කිරීමේ වියදම් | | 514,600.00 | 885,704.61 |
| | මුද්‍රණ වියදම් | | 44,625.00 | 115,819.07 |

| | | සටහන | 2018 | 2017 |
|---|---|---|---|---|
| | ප්‍රදර්ශන වියදම් | | - | 87,012.00 |
| | පාරිභෝජන ද්‍රව්‍ය මිලදී ගැනීම් | | - | 19,702.36 |
| | ප්‍රචාරණ වියදම් | | 653,501.07 | 883,750.00 |
| | අනෙකුත් වියදම් (සැපයුම්) | | 191,708.86 | 47,644.00 |
| | අනෙකුත් වියදම් (සේවා) | | 381,458.85 | 588,995.45 |
| | විගණන ගාස්තු | | 211,735.00 | 150,000.00 |
| | සේ.අ.සා. අරමුදල | | 6,306,876.25 | 6,221,568.56 |
| | සේ.භා. අරමුදල | | 1,596,036.42 | 1,554,985.61 |
| | සේ.අ.සා. අරමුදල (කොන්ත්‍රාත්) | | 446,772.56 | - |
| | සේ.භා. අරමුදල (කොන්ත්‍රාත්) | | 98,814.90 | - |
| | ආරක්ෂක වියදම් | | 123,890.32 | 321,200.00 |
| | පාරිතෝෂිත | | 2,359,090.50 | 3,335,479.00 |
| | විදුලි ගාස්තු | | 9,805.15 | 14,641.65 |
| | ජල බිලිපත් ගාස්තු | | 34,684.86 | 20,751.53 |
| | වෛද්‍ය වියදම් | | - | 21,718.00 |
| | විසිරි නිවාස ණය අයකිරීම් කොමිස් මුදල් | | 1,176,921.23 | 1,116,690.05 |
| | ආධාර | | - | 397,170.00 |
| | නීති වියදම් | | 229,775.00 | 92,461.31 |
| | රඳවාගැනීමේ බදු | | 55,807.83 | 210,454.43 |
| | අඩමාණ ණය | | 202,034.98 | 269,349.42 |
| | ක්ෂය | 08 | 4,234,210.65 | 3,772,788.07 |
| | මෙහෙයුම් කල්බදු වාරික ගෙවීම් | | 12,067,850.00 | 7,629,751.67 |
| | වාහන විකුණුම් මුදල් අමාත්‍යංශය වෙත ප්‍රේෂණය කිරීම | | 5,423,025.00 | - |
| | ආපදා ණය | | 5,694,754.65 | - |
| | | | **138,916,137.51** | **127,895,325.04** |
| **<u>සංවර්ධන වියදම්</u>** | | | | |
| | ලෝක ජනාවාස දින වැඩසටහන් | | 3,239,525.82 | 5,171,083.44 |
| | ප්‍රවාහන ගාස්තු | | 12,295.00 | 96,505.00 |
| | ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන | | 14,024,714.35 | 7,625,040.60 |
| | අඟුලාන නඩත්තු වියදම් | | 3,900,644.00 | 2,203,520.09 |
| | රජ්ගම නිවාස ව්‍යාපෘතිය | | 3,780,676.40 | - |
| | හම්බන්තොට නිවාස ව්‍යාපෘතිය | | - | 1,965,968.49 |
| | අනුරාධපුර නඩත්තු වියදම් | | - | 249,950.00 |
| | ශ්‍රී වික්‍රමපුර වියදම් | | 75,855.70 | - |
| | | | 25,033,711.27 | 17,312,067.62 |
| **මුළු වියදම්** | | | **163,949,848.78** | **145,207,392.66** |
| **කාලච්ඡේදයට අදාළ අතිරික්තය / ඌනතාවය** | | | **(31,002,552.40)** | **(19,844,291.22)** |

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය


## මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

## 2018 - දෙසැම්බර් - 31 දිනට

| | සටහන | 2018 | 2017 |
|---|---|---|---|
| **වත්කම්** | | රු. | රු. |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා බැංකු ශේෂය | 01 | 27,782,099.90 | 74,251,686.45 |
| තොග-සම්පත් මධ්‍යස්ථාන | 02 | 872,100.50 | 946,098.50 |
| මුදල් අත්තිකාරම් | 03 | 162,864.50 | 391,867.82 |
| උත්සව අත්තිකාරම් | | 60,000.00 | 31,250.00 |
| සේවක ණය | | 12,498,859.42 | 17,664,245.64 |
| සේවක ආපදා ණය | | 7,480,417.94 | 12,835,371.38 |
| සේවක ආපදා ණය (2018) | | 4,940,300.00 | - |
| සුභසාධන ණය | | 10,000.00 | 10,000.00 |
| අධ්‍යාපන ණය | | 226,187.58 | - |
| ලැබිය යුතු සේවා ගාස්තු - නා.ජ.සං.අ. | | 207,331,767.00 | 207,331,767.00 |
| ලැබිය යුතු ණය - විසිරි නිවාස (2019 වසර) | | 7,891,445.03 | 9,070,378.49 |
| ලැබිය යුතු ගිණුම් | 04 | 126,528,264.11 | 64,310,473.50 |
| කොන්ත්‍රාත් අත්තිකාරම් | 05 | 2,855,769.83 | 2,855,769.83 |
| අඟුලාන නිවාස තොග | | 67,375,000.00 | - |
| හලාවත නිවාස තොග | | 25,804,236.85 | - |
| අනුරාධපුර (තුරුළුතුරුගම) නිවාස තොග | | 6,328,507.81 | - |
| 48 වත්ත නිවාස තොග | | 34,500,000.00 | - |
| | | 532,647,820.47 | 389,698,908.61 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ණය තොග | 06 | 481,520,577.08 | 418,578,818.72 |
| කෙරීගෙන යන වැඩ | 07 | 1,313,178,287.42 | 1,370,592,291.49 |
| දේපළ, පිරියත හා උපකරණ | 08 | 21,673,360.35 | 9,466,352.56 |
| අඟුලාන නිවාස ව්‍යාපෘතිය | | - | 112,500,000.00 |
| හලාවත නිවාස ව්‍යාපෘතිය | | - | 52,970,619.10 |
| 48 වත්ත නිවාස ව්‍යාපෘතිය (14 නිවාස තොගය) | | - | 34,500,000.00 |
| අනුරාධපුර (තුරුළුතුරුගම) නිවාස ව්‍යාපෘතිය (8 නිවාස තොගය) | | - | 6,328,507.81 |
| | | 1,816,372,224.85 | 2,004,936,589.68 |
| **මුළු වත්කම්** | | 2,349,020,045.32 | 2,394,635,498.29 |

| | සටහන | 2018 | 2017 |
|---|---|---|---|
| **<u>වගකීම්</u>** | | | |
| ජංගම වගකීම | | | |
| උපචිත වියදම් | 09 | 34,872,333.94 | 53,934,497.40 |
| කළමනාකරණ සංස්ථා අරමුදල - අඟුලාන | | 301,000.00 | 11,823,000.00 |
| අඟුලාන ජල ගාස්තු එකතු කිරීම් | | 841,963.86 | 794,291.86 |
| රඳවා ගැනීමේ මුදල් | 10 | 1,299,416.89 | 1,299,416.89 |
| ගෙවිය යුතු ගිණුම් - රීල් සමාගම | | 7,107,859.84 | 7,107,859.84 |
| විසිරි නිවාස ණය - ඉදිරියට ලද මුදල් | | 249,147.42 | 274,303.72 |
| තුරු ඉතුරුගම - ඉදිරියට ලද මුදල් | | 138,509.54 | 105,910.00 |
| ස්වශක්ති - ඉදිරියට ලද මුදල් | | 56,890.68 | 10,182.83 |
| හලාවත - ඉදිරිය ලද මුදල් | | 20,436.07 | 461,599.00 |
| හම්බන්තොට සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන | | 4,514,970.13 | 4,514,970.13 |
| | | 49,402,528.37 | 80,326,031.67 |
| ජංගම නොවන වගකීම් | | | |
| පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් | | 17,887,921.00 | 16,488,828.50 |
| ආපදා ණය සඳහා වෙන් කිරීම් | | 5,694,754.65 | - |
| | | 23,582,675.65 | 16,488,828.50 |
| **මුළු වගකීම්** | | 72,985,204.02 | 96,814,860.17 |
| **<u>ශුද්ධ වත්කම්</u>** | | 2,276,034,841.30 | 2,297,820,638.12 |
| **ස්කන්ධය හා ප්‍රාග්ධනය** | | | |
| භාණ්ඩාගාර ප්‍රදාන | 11 | 2,083,048,500.13 | 2,081,868,530.69 |
| ඒකාබද්ධ අරමුදල | | 12,065,000.00 | 12,065,000.00 |
| ප්‍රාග්ධන සංචිත | 12 | 66,631,144.64 | - |
| ආදායම් සංචිත | | 34,500,000.00 | 93,094,358.50 |
| | | 2,196,244,644.77 | 2,187,027,889.19 |
| **ආදායම්/ වියදම් ශේෂය ඉ/ගෙ** | | 110,792,748.93 | 130,637,040.15 |
| අතිරික්තය/ ඌනතාවය | | (31,002,552.40) | (19,844,291.22) |
| | | 79,790,196.53 | 110,792,748.93 |
| **මුළු ස්කන්ධය** | | 2,276,034,841.30 | 2,297,820,638.12 |


වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ වගකීම් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදි.



---------------------

අධ්‍යක්ෂ (මුදල්)


නා.ජ.ස.අ.



---------------------

අධ්‍යක්ෂ ජනරාල්

නා.ජ.ස.අ.



---------------------

සභාපති

නා.ජ.ස.අ.



---------------------

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

නා.ජ.ස.අ.

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

## මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

## 2018 දෙසැම්බර් 31 දිනට

| | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | |
| **ලැබීම්** | | |
| භාණ්ඩාගාර ප්‍රදාන (පුනරාවර්තන) | 103,650,000.00 | 90,848,450.00 |
| නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | 427,000.00 | |
| අනෙකුත් ආදායම් | 211,152.02 | 369,130.20 |
| පොළී ආදායම් | 804,279.48 | 2,767,857.78 |
| ආපදා ණය පියවීම් | 1,741,533.44 | 8,174,637.34 |
| නා.ජ.සං.අ. - සේවක ණය අයකිරීම් | 4,668,756.26 | 4,711,045.12 |
| සිංහපුර කුලී ආදායම් | 350,000.00 | 431,000.00 |
| ටෙන්ඩර් තැන්පතු | 68,500.00 | |
| ගොඩනැගිලි අලුත්වැඩියා ප්‍රතිපූරණය | | 1,786,059.20 |
| රීල් ආයතනයේ ආදායම් | | 7,107,859.84 |
| | 111,921,221.20 | 116,196,039.48 |
| **වියදම්** | | |
| වැටුප් හා අනෙකුත් දීමනා | 66,230,056.56 | 70,039,754.54 |
| අතිකාල හා ගමන් වියදම් | 4,228,622.27 | 3,490,190.60 |
| සේවා හා සැපයුම් | 9,502,915.80 | 15,224,893.57 |
| ගිවිසුම්ගත සේවා | 22,635,410.66 | 7,314,378.25 |
| නඩත්තු වියදම් | 7,705,779.36 | 5,210,990.91 |
| ණය අයකිරීම් කොමිස් මුදල් | 1,162,917.05 | 1,051,711.95 |
| මුදල් අත්තිකාරම් | 152,314.50 | 179,243.63 |
| | 111,618,016.20 | 102,511,163.45 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **303,205.00** | **13,684,876.03** |
| **ආයෝජන ක්‍රියාකාරකම්** | | |
| **ලැබීම්** | | |
| විසිර් නිවාස ණය වාරික | 6,638,883.94 | 7,913,222.89 |
| අනුරාධපුර ණය වාරික | 1,409,038.00 | 398,775.00 |
| "ස්වශක්ති" ස්වයං රැකියා ණය වාරික | 1,507,869.03 | 787,036.74 |
| මහන මැෂින් ණය වාරික | 871,000.81 | 596,820.00 |
| අඟුලාන ණය වාරික | 923,537.00 | 407,100.00 |

| | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |
| සහස්පුර නිවාස ව්‍යාපෘතිය | 693,536.22 | 549,427.64 |
| සිංහපුර නිවාස ව්‍යාපෘතිය | 298,022.00 | 937,409.61 |
| වඩුල්ලවත්ත නිවාස ව්‍යාපෘතිය | 208,990.00 | 1,192,260.00 |
| ශ්‍රී වික්‍රමපුර ආදායම් | | |
| සනීපාරක්ෂක ව්‍යාපෘතිය | | 4,514,970.13 |
| අඟුලාන - විකුණුම් නිවාස මත මූලික ගෙවීම | 100,000.00 | 514,300.00 |
| හලාවත නිවාස ණය වාරික | 878,561.00 | 447,299.00 |
| අධ්‍යාපන ණය අය කිරීම් | 128,906.18 | |
| හොරණ නිවාස ව්‍යාපෘතිය - සැපයුම්කරුවන් නැවත ගෙවීම | 668,200.00 | |
| රජ්ගම නිවාස ව්‍යාපෘතිය - ණය වාරික මුදල් | 324,685.00 | |
| සහස්පුර ඔප්පු ගාස්තු | 240,200.00 | |
| ස්ථාවර වත්කම විකුණුම් ආදායම් | 1,438,000.00 | 4,067,825.00 |
| සුභසාධක සංගමයේ ණය අයකිරීම් | 1,650,000.00 | |
| නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | 619,532.50 | |
| | 18,598,961.68 | 22,326,446.01 |
| **<u>වියදම්</u>** | | |
| අඟුලාන ප්‍රජා ශාලාව | 2,932,646.63 | |
| අඟුලාන ව්‍යාපෘතිය නඩත්තු වියදම් | 3,993,739.12 | 2,310,874.09 |
| ලුනාව නිවාස ව්‍යාපෘතිය | 12,525,442.59 | 247,612,412.14 |
| තලවකැලේ නිවාස ව්‍යාපෘතිය | 1,768,399.98 | (7,071,000.11) |
| හම්බන්තොට නිවාස ව්‍යාපෘතිය | | 1,965,363.59 |
| හලාවත නිවාස ව්‍යාපෘතිය | | 3,151.00 |
| හොරණ නිවාස ව්‍යාපෘතිය | 1,513,786.65 | 6,314,940.72 |
| අනුරාධපුර නිවාස ව්‍යාපෘතිය | | 243,200.00 |
| රජ්ගම නිවාස ව්‍යාපෘතිය | 11,850,801.30 | 52,595,263.00 |
| මහයියාව නිවාස ව්‍යාපෘතිය | 871,929.60 | 997,801.14 |
| ස්ථාවර වත්කම් මිල දී ගැනීම් | 592,455.00 | 2,566,555.39 |
| සමාජ සජීවීකරණ වියදම් | 20,123,645.95 | 16,009,094.41 |
| නා.ජ.සං.අ. - සේවක නිවාස ණය | | 600,000.00 |
| ආපදා ණය | 4,940,300.00 | 11,436,640.00 |
| අධ්‍යාපන ණය | 407,500.00 | |
| බඹරකැලේ ව්‍යාපෘතිය | 15,108.24 | |
| අඟුලාන නැවත ගෙවීම් | 300,000.00 | |
| අමාත්‍යාංශය වෙත මුදල් මාරු කිරීම - (වාහන විකුණුම්) | 5,423,025.00 | |
| සුභසාධක සංගමයේ ණය | 1,800,000.00 | |
| | 69,058,780.06 | 335,584,295.37 |

| | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (50,459,818.38) | (313,257,849.36) |
| **මූල්‍ය ක්‍රියාකාරම්** | | |
| **ලැබීම්** | | |
| භාණ්ඩාගාර ප්‍රදාන (ප්‍රාග්ධන ක්‍රියාකාරකම්) | 19,340,000.00 | 299,049,179.39 |
| අඟුලාන කළමනාකරණ සංස්ථා අරමුදල | 133,000.00 | 680,480.00 |
| | **19,473,000.00** | **299,729,659.39** |
| **වියදම්** | | |
| වාර්ෂික ප්‍රතිපාදන අමාත්‍යාංශයට ආපසු ගෙවීම"රජ්ගම නිවාස ව්‍යාපෘතිය | 2,536,737.00 | |
| - හොරණ නිවාස ව්‍යාපෘතිය | 1,594,236.17 | |
| අඟුලාන කළමනාකරණ සංස්ථා අරමුදල | 11,655,000.00 | |
| | **15,785,973.17** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **3,687,026.83** | **299,729,659.39** |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩි වීම/ අඩු වීම | (46,469,586.55) | 156,686.06 |
| වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | 74,251,686.45 | 74,095,000.39 |
| වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ | **27,782,099.90** | **74,251,686.45** |

**සටහන - මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

31/12/2018 දිනට මුදල් පොතේ ශේෂය

| | |
|---|---|
| ලංකා බැංකුව - බත්තරමුල්ල (පුනරාවර්තන) - 0010004252 | 6,565,552.32 |
| ලංකා බැංකුව - බත්තරමුල්ල (ප්‍රාග්ධන) - 00071295541 | 4,624,447.52 |
| ලංකා බැංකුව - බත්තරමුල්ල (අනුරාධපුර) - 0072703594 | 2,182,571.17 |
| ඉතුරුම් ගිණුම් - 72697157 | 13,480,388.14 |
| ඉතුරුම් ගිණුම - කළමනාකරණ සංස්ථා අරමුදල - 76710959 | 929,140.75 |
| | **27,782,099.90** |

# නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

## ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

## 2018/12/31 දිනට

| විස්තරය | ආරම්භක ශේෂය | | ප්‍රවර්තන වර්ෂයට අදාළ වෙනස් වීම් | | | | අවසන් ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2017 | | 2018 | | 2017 | 2018 |
| | | | එකතු කිරීම් | අඩු කිරීම් | එකතු කිරීම් | අඩු කිරීම් | | |
| මූලික ප්‍රාග්ධනය | - | - | - | - | | | - | - |
| ඒකාබද්ධ අරමුදල | 12,065,000.00 | 12,065,000.00 | | - | | | 12,065,000.00 | 12,065,000.00 |
| රජයේ ප්‍රදාන | 1,826,800,184.31 | 2,081,868,530.69 | 295,225,387.96 | 40,157,041.58 | 68,248,681.46 | 67,068,712.02 | 2,081,868,530.69 | 2,083,048,500.13 |
| ප්‍රාග්ධන සංචිත | - | - | | | 66,631,144.64 | - | - | 66,631,144.64 |
| සංචිත මුදල් | 93,094,358.50 | 93,094,358.50 | - | - | | 58,594,358.50 | 93,094,358.50 | 34,500,000.00 |
| සමුච්චිත අරමුදල | 130,637,040.15 | 110,792,748.93 | - | 19,844,291.22 | | 31,002,552.40 | 110,792,748.93 | 79,790,196.53 |
| **එකතුව** | **2,062,596,582.96** | **2,297,820,638.12** | **295,225,387.96** | **60,001,332.80** | **134,879,826.10** | **156,665,622.92** | **2,297,820,638.12** | **2,276,034,841.30** |

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එච්යූඩී/සී/යූඑස්ඩීඒ/එෆ්ඒ/18/01

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2019 ජුනි 26 දින

සභාපති

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :- 01. ලේකම් - නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

02. ලේකම් - මුදල් අමාත්‍යාංශය

URBAN SETTLEMENT DEVELOPMENT AUTHORITY
1170
01 JUL 2019
Chairman Office

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | එච්යූඩී/සී/යූඑස්ඩීඒ/එෆ්ඒ/18/01 | |
| ඔබේ අංකය / உமது இல. / Your No. | | |
| දිනය / திகதி / Date | | 2019 ජුනි 26 දින |

සභාපති

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 14 වන වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් නිවාස ක්‍රම 02 කින් රු.මිලියන 1.08 ක ණය වාරික මුදල් අයකළද එම වත්කම් වල වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දක්වා නොතිබුණි.

(ආ) පිරිවැය රු.මිලියන 36.49 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම 4 කට අදාළව වාර්ෂික ක්ෂය ගණනය කර නොතිබුණු අතර එම වත්කම් මෙනවාද යන්න හඳුනා ගැනීමටද කටයුතු කර නොතිබුණි. එසේම ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 1.1.3. (ii) පරිදි, අධිකාරිය විසින් ජංගම නොවන වත්කම් වසර 05 කට වරක් ප්‍රත්‍යාගණනය කරන බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 5 ඉක්ම වූ කිසිදු වත්කමක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ඇ) අනුරාධපුර "තුරුඉතුරුගම හරිත ජනාවාස ව්‍යාපෘතියෙහි" නිවාස 21 ක නිවාසලාභින්ගෙන් ලැබිය යුතු ණය වාරික වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඔවුන්ගෙන් ලද ණය වාරික ආදායම වූ රු.361,700ක් පමණක් වෙනත් ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) අනුරාධපුර තුරු ඉතුරුගම ප්‍රදේශයේ සුධාරක තාක්ෂණය යටතේ ඉදිකරන ලද නිවාස 09 සහ ඊට අදාළ ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂයේ දී අධිකාරිය විසින් අපහරණය කරන ලද මොටර් රථ 3 ක් සඳහා ලැබුණු රු. 5,423,025 ක් භාණ්ඩාගාර නියමය පරිදි ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණි. එසේ වුවත් එම මුදල අධිකාරියේ වියදමක් ලෙසද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ ඌනතාවය එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි.

(ඊ) ත්‍රිකුණාමලය නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් 2013 වර්ෂයෙහි අධිකාරියට ලැබුණු රු.මිලියන 25 ක භාණ්ඩාගාර ප්‍රදාන නැවත 2015 වසරේදී භාණ්ඩාගාරය වෙත නිදහස් කර තිබූ අතර ගිණුම් තැබීමේ දෝෂයක් නිසා එයින් රු. මිලයන 5 ක් අහුලාන නිවාස ව්‍යාපෘති පිරිවැයෙන් අඩුකර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම නිවාස ව්‍යාපෘතියේ පිරිවැය එම වටිනාකමින්ම ඌන ගණනය වී තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට සහස්පුර නිවාස ව්‍යාපෘතියේ පුනස්ථාපන පදනම මත ලබාදුන් නිවාස 48 ක් සඳහා අයවිය යුතු කුලී ආදායම මූල්‍ය ප්‍රකාශන අනුව රු.1,117,256 ක් වුවද උපලේඛන අනුව එම අගය රු. 1,386,954 ක් වුයෙන් ඒ අතර රු.269,698 වෙනසක් විය.

(ඌ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16(3) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රු.මිලියන 5,000 ක් විය යුතු අතර එය කොටස් වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් ලැබිය යුතු වුවද 2018 වර්ෂය නිම වන විටත් අධිකාරියට කිසිදු ප්‍රාග්ධනයක් ලබාදී

2

නොතිබුණි. එසේම 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16 (ඉ) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව අඩු වියදම් නිවාස වැඩසටහන්වලට මුදල් සැපයීම සඳහා දේපල සංවර්ධනය කරන්නන්ගෙන් සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කරගනු ලබන සියලු මුදල් ජනාවාස සංවර්ධන අධිකාරියේ අරමුදලට බැර කළ යුතුව තිබුණි. එසේ වුවත් 2010 දෙසැම්බර් 14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම සේවා ගාස්තු අයකිරීම නවතා තිබුණු බැවින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට සිය ප්‍රධාන ආදායම් මාර්ගය අහිමි වී තිබුණි. මේ අනුව මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන නොමැතිව අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යා නොහැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ඊ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණ හැර** යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති/ විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ 136 | වවුචර් පිළිබඳ කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී රු.20,577,568 ක් වටිනා වවුචර් පත් 39 ක් නිර්දේශ කළ යුතු නිලධාරියා විසින් නිර්දේශ (Recommend) කර නොතිබුණි. |
| (ii) මු.රෙ 371 (2) (ආ) | සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 77 කදී නිලධාරීන් 37 දෙනෙකු වෙත ලබාදී තිබු රු.1,264,256 ක අතුරු අග්‍රිම පියවීමට දින 35 සිට දින 360 ක් දක්වා වු කාලයක් ගතකර තිබුණි.<br>එසේම රු.100,000 කට වඩා තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය යුතු වන්නේ මාණ්ඩලික නිලධාරීන්ට පමණක් වන අතර, එම සීමාවන් ඉක්මවීමට අවශ්‍ය වන්නේ නම් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශයද සහිත ඉල්ලීමක් මගින් මහා භාණ්ඩාගාරයේ පූර්ව අවසරය ලබාගත යුතු වුවද, මෙම උපදෙස්වලට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 14 රු.3,610,000 අත්තිකාරම් ලබාදී තිබුණි. |
| (iii) මු.රෙ.770 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදි හදුනාගත් අපහරණය කළ යුතු අයිතම 40 කට අයත් භාණ්ඩ 155 ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 1645 | වාහන සඳහා පවත්වාගෙන යන ලොග් පොතෙහි ගමන් පිළිබඳ මාසික සාරාංශයක් ඇතුළත් කළ යුතු වුවද අධිකාරියේ වාහන වල එම තොරතුරු ක්‍රමානුකූලව යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ | පොදු ආකෘති 287 ප්‍රකාරව අධිකාරිය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මාසිකව රජයේ වාහන සඳහා භාවිතා කළ ඉන්ධන ප්‍රමාණය, ධාවනය කළ කිලෝ මීටර් ගණන, මාසය තුළ කළ අළුත්වැඩියාවන් යනාදිය ඇතුළත් කොට ප්‍රවාහන සේවා සටහනක් සකස් කළ යුතු වුවද ඒවා ක්‍රමානුකූලව යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඈ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 වගන්තිය | රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවන්හිදී, නිසි අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව දරන ලද සත්‍ය ඉන්ධන වියදම ප්‍රතිපූරණය කළ හැකි වුවද, එකී අනුමැතීන් ලබා ගැනීමට ප්‍රථම, අතිරේක ඉන්ධන භාවිතා කර එම මාසය අවසානයේදී අදාල අනුමැතීන් සඳහා යොමු කර තිබුණි. |
| (ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.3.1 (ආ) ඡේදය | ඉදිකිරීම් ප්‍රසම්පාදන කටයුත්තක් ආරම්භ කිරීමට පෙර, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ඉදිකිරීමට අදාළ ඉඩම් අත්කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ඇති බව සහ ව්‍යාපෘතිය බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු කරුණු ඉටුකර තිබිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුරාධපුර අගුලාන සිංහපුර තලවකැලේ සහ ලුනාව නිවාස ව්‍යාපෘතියට අයත් ඉඩම් අත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණ හැර** අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

    (අ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත ප්‍රකාරව නාගරික ජනාවාස සංවර්ධනයට අදාල ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන බවට සහතික වීම සඳහා අධිකාරිය ස්ථාපනය කර තිබුණද, අධිකාරිය පිහිටුවා වර්ෂ 10 ක් ගතවුවද මෙකී ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි. පනතේ 10 වගන්තිය අනුව අධිකාරිය විසින් සභාපතිවරයකුද ඇතුළත්

සාමාජිකයන් 14 දෙනෙකුට වැඩි නොවන උපදේශක කමිටුවක් 2017 අප්‍රේල් වනවිට පත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරියේ යෝජනා, සැලසුම්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරී සැලසුම් යනාදී අධිකාරියේ අරමුණු වලට අදාල කාර්යයන් හඳුනාගෙන නොතිබුණි.

(ආ) නිවාස ව්‍යාපෘති 2 ක නිවාස 161 ක් ඒවායෙහි පිරිවැයට වඩා අඩුවෙන් නිදහස් දීමනා පත්‍ර මත ලබා දී රු.62,937,739 ක හිඟ මුදල සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර ප්‍රදාන වලින් ලියා හැර තිබුණු නමුත් ඒ සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණ හැර** අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1. අනුව අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය සහිත විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) හලාවත නිවාස ව්‍යාපෘතියේ කාණු පද්ධතිය සැකසීමට 2015 වර්ෂයේදී රු.මිලියන 2.86 ක් අධිකාරියට ලැබී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම කාර්යය ඉටු කර නොතිබුණු අතර කිසිදු භෞතික ප්‍රගතියක් අත්කරගෙනද නොතිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.18 (ආ) පරිදි, ලංසු ඇගයීමේදී එකතු කළ අගය මත බදු (VAT) සැලකිල්ලට නොගත යුතු වුවද, අධිකාරිය සිදුකළ සියළුම ප්‍රසම්පාදන කාර්යයන්වලට අදාළ තාක්ෂණික ඇගයීමේදී එකතු කළ අගය මත බදු ලියාපදිංචි ලංසුකරුවන් එවන ලද ලංසු මිල ගණන් බදු සහිත අගයටද, බදු වෙනුවෙන් ලියාපදිංචි වී නොමැති ලංසුකරුවන් එවන ලද ලංසු මිල ගණන් බදු රහිත අයටද, ඇගයීමට ලක් කර තිබුණි. මෙම තත්ත්වය මත ප්‍රසම්පාදන කටයුතුවලදී බදු සඳහා ලියාපදිංචි නොවූ ලංසුකරුවන්ට වාසිකදායක වන අයුරින් අධිකාරිය කටයුතු කර තිබුණි.

(ඈ) අගුලාන සයුරුපුර නිවාස ව්‍යාපෘතියේ වෙළඳ සංකීර්ණය සහ කසළ බැහැරකරන ස්ථානය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ ගිවිසුම් ගත කාලය 2016 සැප්තැම්බර් 27 දින වන විට අවසන්ව තිබූ නමුත් 2019 මැයි වන විටත් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමටකටයුතු කර නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු වෙත ගෙවන ලද රු. 2,803,447 අත්තිකාරම් මුදල් පියවා

8

ගැනීමටද අධිකාරිය අපොහොසත්ව තිබුණි. එමෙන්ම අනෙකුත් කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දුන් රු.2,855,769 ක අත්තිකාරම් මුදල් වසර 05 ඉක්මවා තිබුණද ඒවා පියවා ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ඉ) ලුනාව නිවාස ව්‍යාපෘතිය සඳහා ඉකුත් වර්ෂයේදී රු. මිලියන 90 ක් වැයකොට සම්පූර්ණයෙන්ම නිම කිරීමට සැළසුම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ව්‍යාපෘතියේ වැඩ අවසන් කර නොතිබීම හේතුවෙන් එම නිවාස ප්‍රතිලාභීන්ට ලබා දීම ප්‍රමාද වී තිබුණි.

**3. වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) අධිකාරිය විසින් ඉදිකරන ලද හා ඉදිකරමින් පවතින නිවාස යෝජනා ක්‍රම 05 ක පවතින නිවාස ඒකක 863 කට අදාල හෙක්ටයාර 12.32 ක ඉඩම් විවිධ ආයතනවලින් පවරා ගැනීමට 2011 වර්ෂයේ සිට කටයුතු කළද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ඉඩම් පවරා ගැනීමට අපොහොසත්ව තිබුණි. එම හේතුවෙන් නිවාසලාභීන්ට ඉඩම් ඔප්පු ලබාදීමේ ප්‍රමාදයන් සිදුවන බව විගණනයේදී වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(ආ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය අවසානයට භාණ්ඩාගාර ප්‍රදාන මගින් රු.මිලියන 1,172 ක් වැයකර ලුනාව නිවාස යෝජනා ක්‍රමය වෙනුවෙන් නිවාස ඒකක 380 ක් ඉදිකර තිබුණද 2012 මාර්තු 22 දින විෂයභාර අමාත්‍යවරයා ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3 වන වගන්තිය පරිදි එම නිවාස වල පදිංචි කිරීමට මොරටුව මහ නගර සභා සීමාවේ පදිංචි අඩු පහසුකම් නාගරික ජනාවාස පවුල් 356 ක් හඳුනාගැනීමට සමාලෝචිත වර්ෂය අවාසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදි භාණ්ඩාගාර ප්‍රදාන මත අධිකාරිය විසින් ඉටු කිරීමට අපේක්ෂා කළ රු. මිලියන 1,270.08 ක් වටිනා ව්‍යාපෘති 07 කින් කිසිදු මුල්‍ය හෝ භෞතික ප්‍රගතියක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලඟා කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. මෙම තත්ත්වය අධිකාරියේ කළමනාකරණ දුර්වලතාවයක් ලෙස වැඩි දුරටත් නිරීක්ෂණය කරනු ලැබේ.

(ඈ) නිවාස ව්‍යාපෘති 8 කින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අධිකාරියට අයවිය යුතු රු. 145,809,189 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.57,958,051 පමණක් අයකර ගෙන තිබුණු අතර එම වටිනාකම අයවිය යුතු මුදලින් සියයට 36 ක් විය. ණය එකතු කර ගැනීම දිරි ගැන්වීම සඳහා සමාලෝචිත වර්ෂයේදි අධිකාරිය කොමිස් මුදල් ලෙස රු.1,176,921 ක් ගෙවා තිබු අතර ණය එකතු කර ගැනීමේ ප්‍රගතියේ ඉතා දුර්වල මට්ටමක පැවතුණි. තවද ව්‍යාපෘති 04 ක ණය එකතු කර ගැනිමේ ප්‍රගතිය සියයට 10 අඩු ප්‍රතිශතයක් අත්කරගෙන ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඉ) තලවකැලේ ලිදුල නිවාස ව්‍යාපෘතියෙහි වැඩ අවසන් කළ නිවාස 54 ක් වර්ෂ 04 පමණ කාලයක සිට ප්‍රතිලාභීන් වෙත භාරදී නොදීම හේතුවෙන් නිවාසවලට හානි වීම් සිදුවී ඇති අතර එම නිවාස නැවත අළුත්වැඩිය සිදු කළ යුතු මට්ටමකට අබලන්ව ඇති බව අනාවරණය විය. එසේම ව්‍යාපෘතිය මගින් පුනස්ථාපන පදනම මත නිවාස ඒකක 60 ක් ලබා දීමට සැලසුම්කර තිබුණද නිවාස ඒකක 54 ක් පමණක් ඉදිකර තිබුණි. එහිදී ව්‍යාපෘති අරමුණුවලට පටහැනිව පුනස්ථාපනය කිරීමට අදාළ නොවන පුද්ගලයින් 10 දෙනෙකුට ව්‍යාපෘතිය තුළ නිවාස වෙන් කර දී තිබුණි.

(ඊ) අධිකාරිය ඉකුත් වර්ෂයේදී අනුරාධපුර "තුරුඉතුරුගම" නිවාස ව්‍යාපෘතියේ නිවාස හිමියන් සමඟ විකුණුම් ගිවිසුම්වලට එළඹ තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම නිවාස ව්‍යාපෘතියේ පුනස්ථාපන පදනම මත ලබාදුන් නිවාස ඒකක 12 ක සහ විකුණුම් පදනම මත ලබාදුන් නිවාස ඒකක 09 ක නිවාසලාභීන් සමඟ විකුණුම් ගිවිසුම්වලට එළඹ නොතිබුණි. එසේම හලාවත නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස 57 ක් ඉදිකර ප්‍රතිලාභීන් වෙත ලබා දී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිවාසලාභීන් 25 දෙනෙකු සමග විකුණුම් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(උ) ව්‍යාපෘති වටිනාකම රු. බිලියන 13.43 ක් වූ, අධිකාරිය විසින් ඉකුත් වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කිරීමට සැලසුම් කළ මහනුවර, මහයියාව නාගරික නිවාස ව්‍යාපෘතියේ වැඩ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. සුදුසුකම්ලත් ආයෝජකයකු ව්‍යාපෘතිය සඳහා තෝරා ගැනීමට අධිකාරියට නොහැකි වීම මෙම තත්ත්වයට බලපා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම රු.1,869,731 ක් විය.

(ඌ) අධිකාරිය විසින් අඟුලාන නිවාස ක්‍රමයෙහි පැවැති රු.මිලියන 134.03 ක් වටිනා නිවාස ඒකක 45 ක් මුදල් අයකිරීමකින් තොරව නිදහස් දීමනා පත්‍රයක් මගින් බැහැර කර තිබුණද 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 26 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිවාස බැහැර කිරීම් ක්‍රමවේදයක් හඳුනාගැනීමට අධිකාරිය අපොහොසත්ව තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට හම්බන්තොට නිවාස ණය ව්‍යාපෘතිය වෙනුවෙන් ලබාදුන් ණය මුදල රු.3,656,154 ක් වූ අතර එම ණය මුදලට අදාල පොලිය භාණ්ඩාගාරයේ හෝ රේඛීය අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත අයනොකිරීමට කටයුතු කර තිබුණු අතර මේ සඳහා මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී හෝ කටයුතු කර නොතිබුණි.

(ඒ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී විසිරි නිවාස ප්‍රතිලාභීන්ගෙන් අයකර ගත් රු.මිලියන 13.85 ක් වූ ණය වාරික වට්නාකම 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ පනතේ 16 වගන්තිය පරිදි අරමුදලකට බැර නොකර අධිකාරියේ අයභාර වියදම් සඳහා වැය කර තිබුණි. එසේම නාගරික සංවර්ධන අධිකාරියේ එකඟතාවයකින් තොරව අධිකාරියේ කළමනාකරණය ගත් තනි තීරණයක් මත නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු කාර්යාල කුලිය ගෙවීම අත්හිටුවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ හිටි කාර්යාල කුලිය රු.මිලියන 28.53 ක් විය.

(ඔ) අධිකාරිය වෙත අමාත්‍යාංශයෙන් පවරාගෙන තිබු පිරිවැය රු.මිලියන 7.50 ක් වූ ජීප් රථයක් අළුත්වැඩියා කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 4.20 ක් වැයකර තිබුණි. එම වියදම වාහනයේ වටිනාකමින් සියයට 56 ක ප්‍රතිශතයක් වූ බැවින් එම අළුත්වැඩියාවේ ආර්ථිකබව විගණනයේදී ගැටළු සහගත කරුණක් විය. එමෙන්ම මෙම වාහනය සමාලෝචිත වර්ෂයේ ධාවනය කර තිබුණු දුර කිලෝ මීටර 1319 ක් පමණ විය.

(ඕ) අධිකාරියට අයත්ව තිබුණු සමාගමක් ඈවර කිරීමට අදාල අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2012 දෙසැම්බර් 31 දිනට එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව පැවති රු.20,429,773 ක වත්කම් අධිකාරියට පවරා ගතයුතුව තිබුණද එම වත්කම්වලින් එදිනට ශේෂව පැවැති රු.3,880,025 ක බැංකු ශේෂය අධිකාරිය වෙත පවරාගෙන නොතිබුණි. එසේම බාහිර පාර්ශවයන් වෙත ගෙවිය යුතු වූ රු. 7,107,859 ක වගකීම්ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය අවසානය වන විට නිවාස ව්‍යාපෘති 02 ක් වෙනුවෙන් අධිකාරිය වෙත ලැබුණු රු. මිලියන 1336.31 ක භාණ්ඩාගාර ප්‍රදාන වලින් රු. මිලියන 38.09 ක් එම අරමුණෙන් බැහැර වෙනත් වියදම් වෙනුවෙන් භාවිතා කර තිබුණි.

( ග ) අධිකාරිය සතු නිවාස යෝජනා ක්‍රම 05 ක පවතින නිවාස 83 ක් වසර 1 ත් වසර 4 ත් අතර කාලයක සිට භාවිතයට නොගෙන වසා දමා තිබීම හේතුවෙන් අධිකාරියට රැස්කර ගත හැකිව තිබූ කුලී ආදායම අහිමිවී තිබුණි. එසේම සමාජ සජීවීකරණ වැඩසටහන යටතේ බෙදා දීම සඳහා 2014 වර්ෂයේදී රු.184,995 කට මිලදී ගත් ජුකී මහන මැෂින් 05 ක් හා 2016 වර්ෂයේදී රු.659,970 කට මිලදී ගත් සාමාන්‍ය මහන මැෂින් 30 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රතිලාභීන් වෙත බෙදා දී නොතිබූ අතර එහි පිරිවැය අවසාන තොගයටද ඇතුළත් කර නොතිබුණි.

(ජ) විසිරි නිවාස ණය වැඩසටහනෙන් පළමු හා දෙවන අදියර යටතේ ලැබිය යුතු ණය වාරික වටිනාකම රු.මිලියන 33 ක් වූ අතර අවුරුදු 2 ට වැඩි ණය ශේෂය රු.මිලියන 12.83 ක් විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති